

# බුදුසරණ


ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566ක් වූ වප් අමාවක පෝද 2022 ඔක්තෝබර් 24 සඳුද BUDUSARANA MONDAY OCTOBER 24, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 19 පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13


වීථිවච්ඡ ජාතක කතාව ඇසුරිනි

බුදුසරණ

# වටිනාකම් රැකෙන්නේ වත්පොහොසත්කම් මත ම නොවේ



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ**
**අමරවංශ හිමි**

**අනුරාධපුර යුගයේ දී බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලක්දිව පුරා ව්‍යාප්ත වුණා. භික්ෂූන් වහන්සේත් ඒ ධර්ම මාර්ගයේ පිහිටා කටයුතු කරන්න පටන් ගත්තා.**

මෙකල තිබුණා උත්තරෝලිය නම් ගමක්. අනුරාධපුර නගරයට ඈතින් තමයි පිහිටලා තිබුණේ. ගම්වැසියෝ ජීවත්වීමට විවිධ රැකියාවල නිරත වුණා. එක් මහලු මවක් සහ පුතෙක් ජීවත් වුණා බොහෝම දුක සේ. වගා කරන්න ඔවුන්ට අයත් ව ඉඩමක්වත් තිබුණේ නෑ. ජීවත් වෙන්න කළේ පොහොසත් මිනිසුන්ට සේවය කිරීමයි.

පුතා කලක් දුර පළාත්වල සේවය කළා. එහෙත් මව රෝගීවීමත්, මහලු වියේ සිටීමත් නිසා නිවසේ සිටම රැකියාවක් කරන්න තීරණය කළා. ගම් පෙදෙසේ රැකියාවක් සොයා වෙහෙසුණත් ලැබුණේ නෑ.

විශාල ගව පට්ටියකට හිමිකම් කියන මිනිසෙක් රැකියාවක් සොයා වෙහෙසෙන තරුණයා දැක ගවයන් බලා ගැනීමට කැමැති දැයි අසා ඔහුට ගොපල්ලකු ලෙස සේවය කිරීමට අවස්ථාව දුන්නා. තරුණයාත් සතුටින් රැකියාව කරමින් කල්ගත කළා. මවත් රැක බලා ගත්තා.

දවසක් මව අලුයම නැඟිට වැඩට යන්න සූදානම් වන පුතා අමතා කිව්වා.

‘පුතේ උදේට කාලා යන්න කිසිම දෙයක් නෑ, බඩගිනි වුණහම කන්න මේ කටු අල කෑල්ල අරගෙන යන්න’යි කියා එක් කටුඅල කෑල්ලක් දුන්නා. එහෙත් එය පිලුණු වී තිබුණා.

තරුණයාගේ පිරිසුදුකමක් නම් නෑ. නිතර දූවිලිවලින් පිරී ගිය ශරීරයකින් සහ කෙට්ටක් සහිතවයි දකින්න ලැබුණේ. තරුණයා කොතරම් අපිරිසුදුවට හිටියත් ඔහුගේ සිත කරුණාවෙන් පිරී තිබුණා. ගවයින්ට ආදරයෙන් කථා කළා. තණ කැවීම් සහ ජලය පෙවීම් ආදිය ආදරයෙන් ඉටුකළා.

දූවිලි පිරුණු අත්වලින් කටු අල කෑල්ලත්, කෙට්ටත් අරගෙන පිටත් වුණා.

අතරමඟ දී එක් පිණ්ඩපාතික තෙරුන් වහන්සේ නමක් දැකලා ඔහුට හිතුණා කටුඅල කෑල්ල පූජා කරන්න. පාත්‍රයට ඉතා ශ්‍රද්ධාවෙන් එය පූජා කළා. තෙරුන් වහන්සේ තරුණයාගේ හැඩරුවත්, ශ්‍රද්ධා මහිමයත් දුටුවා.

‘මේ තරුණයා ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කරන කෙනෙක්, මට පූජා කළ මේ ආහාරය පෘථග්ජනව වැළඳුවහොත් ලැබෙන ආනිශංස අඩු වෙන්න පුළුවන්. රහත් බවට පැමිණ මිස මෙය වළඳන්නේ නම් නෑ”යි අධිටන් කරගෙන විහාරයට වැඩම කර විදසුන් වඩා අර්හත් භාවය ලබා ගෙන එය වැළඳුවා. තෙරුන් වහන්සේ පිලුණු වූ කටුඅල කෑල්ල විසි කර දමා වෙනත් ආහාරයක් අපේක්ෂාවෙන් පිණ්ඩපාතයේ වැඩම කළේ නෑ. තරුණයාගේ අපිරිසුදුකම දැක ඉවත් කළේ නෑ. හොඳින් සකස් නො කළේ යැයි ඉවත් කළේත් නෑ. කිලිටි අත්වලින් ගෙන ආවේ යැයි ඉවත දැමුවේත් නෑ. ගොපලු තරුණයා කෙරෙහි කරුණාවෙන් ම එය වැළඳුවා.

ඔහුගේ පරලොව ජීවිතය සාර්ථක කර දුන්නා. තරුණයාගේ ආයු කෙළවර කළුරිය කොට එගම ම එක් කුල ගෙයක කුල කාන්තාවකගේ කුසෙහි පිළිසිඳ ගත්තා.

මහරහතන් වහන්සේ නමකට කටුඅලයක් පූජා කිරීමේ පෙර පින් බලයෙන් මහා නිධානයක් ඔහු වෙනුවෙන් පහළ වුණා. උත්තරෝලිය ගමේ පිහිටා තිබුණා මහා වැවක්. කුමාරයාගේ මව වැවට පැමිණෙන තුරු නිධානය වැවේ ඔබ මොබ පාවෙමින් තිබුණා.

දිනක් ගම්වැසි ස්ත්‍රියක් ස්නානයට වැවට ගිය වේලේ නිධානය දැක එය ලබා ගන්න උත්සාහ කළා. බොහෝ වේලාවක් කැප කර නිධානය අතින් අල්ලා ගත්තා. ඇගේ අත නිධානයේ ඇලී ගියා. එවිට ඒ අත ඇදගෙන අනෙක් අතින් අල්ලා ගත්තා. කිහිප විටක්ම මෙසේ කර නිධානය ගොඩට ගැනීමට උත්සාහ කළා. නිධානයට අධිගෘහිත දෙවියන් ඇයගේ අත ගැනීමට නොහැකි ලෙසට ම නිධානයට බද්ධ කළා. ස්ත්‍රිය බොහෝ බියට පත් ව, තමන් සතු ආභරණ සහ වස්ත්‍ර නිධානයට දමා දෙවියන් යදිමින් ජීවිතය ඉල්ලා සිටියා. ඇය එවිට එයින් නිදහස් වුණා.

ස්ත්‍රිය මේ පුවත ගම පුරාම ප්‍රචාරය කළා. වැවේ පාවෙන නිධානය බලන්න ගම් වැසියන් වගේම අවට ගම්වල අයත් පැමිණෙන්න පටන් ගත්තා. වැව වටේට ම පිරිස පිරී ඉතිරී ගිහින්. ඒ හැමෝම ‘අනේ දෙවියනි, මගේ ළඟට නිධානය පැමිණේවා, මගේ ළඟට නිධානය පැමිණේවා’යි ප්‍රාර්ථනා කරන්න පටන් ගත්තා. නිධානය ඒ කිසිම කෙනෙක් ළඟට ගියේ නෑ.

තරුණයා පිළිසිඳගෙන සිටින මවත්, අරුම පුදුම නිධානය බලන්න පුංචි පුතු ඇකයෙනුත් අරගෙන එතැනට ගියා. සෙසු පිරිස් වගේ ම ඇයත් නිධානය ලබා ගන්න ප්‍රාර්ථනා කළා.

පළමුව තමන්ගේ පුණ්‍ය මහිමයක් වේ නම් නිධානය පැමිණේවා’යි ප්‍රාර්ථනා කළා. එහෙත් පැමිණියේ නෑ.

දෙවැනියට ඇකයේ සිටින දරුවාගේ පින් බලයක් වේ නම් පැමිණේවා’යි ප්‍රාර්ථනා කළා. එයට ද නිධානය කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නෑ.

තෙවැනියට කුසහොත් දරුවාගේ පුණ්‍ය මහිමයක් වේ නම් නිධානය පැමිණේවා’යි ප්‍රාර්ථනා කළා. ඇයගේ එම ප්‍රාර්ථනාවත් සමඟ වැව මැදින් වහා නිධානය මතු වී ඇය ඉදිරියට පැමිණ කැරකෙන්න පටන් ගත්තා. නිධානය ගෙන යන්න ඇයට නොහැකි නිසා ‘ඔබට සුදුසු තැන ඔබම දනුව‘යි ප්‍රකාශ කළා.

ඇයගේ වදනත් සමග නිධානය පෙරළෙමින් නිවසට ගොස් සුදුසු තැනක පිහිටියා. කුමාරයා බිහි වී පස්වැනි වියට පා තැබුවා. නිධානයෙන් සියලු අවශ්‍යතා ඉටුකර ගත්තා. කුමාරයාගේ අවශ්‍යතාවලට පමණයි එයින් යමක් ලබා ගත හැකි වන්නේ.

කුමාරයාගේ වයස අනුව අකුරු කියවන්න නැකැත් යොදා දිනයක් ද වෙන් කර ගත්තා. නිධානයෙන් ගත් ආභරණ සහ වස්ත්‍ර ගෙන ඒදින කුමාරයා සැරසුවා. ගම්වැසියන්ටත්, නෑදෑයින්ටත් ආරාධනා කළා.

වැවට ගොස් නිධානය ලබා ගැනීමට උත්සාහ කළ ස්ත්‍රියත් මේදින පැමිණ සිටියා. ඇය කුමාරයාට අන්දවා ඇති වස්ත්‍ර දැක ඒවා තමාගේ බව කියමින් දබර කරන්න පටන් ගත්තා. කුමාරයාගේ මව සියලු පුවත් ඇයට දැන්වූවා.

ඇය, රජුට හොරෙන් නිධානයක් භුක්ති විඳින බවත්, නිධාන නම් රජුට අයත් බවත් පවසමින් පුවත් සියල්ල රජුට වාර්තා කළා. රාජපුරුෂයන් යවා එය ගෙන්වා ගැනීමට නියෝග කළා. නිධානයට අත ගසන හැමෝම නිධානයට ම ඇලී යන බවත්, නැවත අත් මුදවා ගන්නට නොහැකි බවත් රජුට දැන්වූවා.

‘එසේ නම් නිධානය හිමි අය සමග නිධානය ගෙන එන්න’

යැයි නියෝග කළා. කුමාරයාත්, මවත්, පියාත් සෙසු නෑයිනුත් රජු වෙතට එළැඹ පෙනී සිටියා.

රජතුමා ඔවුන් අමතා

‘පින්වත, ඔබගේ නිධානයෙන් මටත් ධනය දෙව‘යි නියෝග කළා. කුමාරයා ජල බඳුනකින් ජල බිඳු කිහිපයක් නිධානයේ කටට ඉස්සා. අදහා ගත නොහැකි ධන රාශියක් එයින් නිකුත් වුණා. රජතුමා මහත් සතුටට පත් ව උත්තරෝලිය ගම ඔහුට ම පවරා දී බොහෝ තෑගි භෝගත් පිරිනැමුවා. ඔහු වැඩිවියට පැමිණ බොහෝ පින්කම් කොට දිවි කෙළවර අඹුදරුවන් සමඟ දිව්‍ය සම්පත් හිමි කර ගත්තා.

යමෙක් පැහැදුණු සිතින් ඉතා කුඩා දෙයක් හෝ සිල් ගුණයෙහි පිහිටි අයකුට දෙන්නේ නම්, එයින් විපුල ඵල ලබන බව මේ කතා පුවත පෙන්වා දෙනවා. දුර්ලභව ලැබූ මනුෂ්‍ය ජීවිතයේ දී සිල්වත්, ගුණවත් උතුමන් වහන්සේ හමුවන අවස්ථාවල දී ප්‍රයෝජන ගෙන පරලොව සාර්ථක කර ගන්නා ලෙස මේ කතා පුවත උපදෙස් දෙනවා.



# අනුරාධපුර පූජනීය අටමස්ථානයේ වර්තමාන සංවර්ධනයේ නියමුවාණෝ

## ආචාර්ය පල්ලේගම සිරිනිවාස නා හිමිපාණන් වහන්සේ



**අනුරාධපුර අටමස්ථානාධිපති ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරිනිවාස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පසුගිය 18 දින අපවත්වී වදාළහ. අපවත්වන විට උන්වහන්සේ හැත්තෑ වැනි වියේ පසුවූහ.**

උන්වහන්සේ මෙතෙක් අටමස්ථානාධිපති තනතුරු දැරූ බෝමලු පරම්පරාවේ දහවැනි අටමස්ථානාධිපතින් වහන්සේ ය. වර්ෂ 1953 දී මාතලේ වගපනහ පල්ලේසිය පත්තුවේ පල්ලේගම ග්‍රාමයේ උපත ලැබූහ. පල්ලේගම දුක්ගන්නා වලව්වේ කුළුදුල් පිරිමි දරුවා ලෙස උපත ලද සිරිනිවාස නාහිමියන්ගේ පියාණන් වූයේ කරුණාසිංහ මුදියන්සේලාගේ ටිකිරිබණ්ඩා නිලමේතුමා ය. මෑණියන් දුක්ගන්නා වලව්වේ අනුලා කුමාරිහාමි මාතාව ය. මෙම කුමරුවා කිතුල්හිටියාව රජයේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබුවේ ය. හත්වැනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලබා 1968 වර්ෂයේ මැයි මාසයේ දිනක දී රුවන්වැලි මහා චෛත්‍යාරාමයේ දී එවකට අටමස්ථානාධිපති ව වැඩ විසූ උදුරුව හල්මිල්ලෑව ශ්‍රී රේවත නා හිමියන්ගේ අනුමැතියෙන් පල්ලේගම ධම්මරක්ඛිත නාහිමියන්ගේ හා පල්ලේගම ඤාණරතන හිමියන්ගේ ආචාර්යත්වයෙන් පල්ලේගම සිරිනිවාස නමින් සසුන් බිමට ඇතුළත් විය.

ඉන් අනතුරුව උන්වහන්සේ භික්ෂු අධ්‍යාපනය සඳහා අනුරාධපුර මහා විහාර පිරිවෙනට ඇතුළත් කිරීමට පල්ලේගම ධම්මරක්ඛිත නා හිමියෝ කටයුතු කළහ. ඉන් අනතුරුව කොළඹ මාළිගාකන්ද විද්‍යෝදය මහ පිරිවෙනෙන් හා සඳලංකාවේ ශාස්ත්‍රෝදය පිරිවෙනෙන් ද හුණුපිටිය ගංගාරාමයේ ජිනරතන පිරිවෙනින් ද අධ්‍යාපනය ලබා 1983 දී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්හ.

1975 වර්ෂයේ වෙසක් මස 06 වැනි දින ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර උපෝසථාගාරයේ දී හේරත් හල්මිල්ලෑවේ රේවත නා හිමි, පල්ලේගම ධම්මරක්ඛිත නා හිමි, පල්ලේගම ඤාණරතන නාහිමි යන හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් මල්වතු මහා විහාරයේ උපෝසථාගාරයේ දී උපසම්පදාව ලැබූහ.

1977 වර්ෂයේ දී අටමස්ථානාධිපති ව වැඩ විසූ උදුරුව හල්මිල්ලෑවේ ශ්‍රී රේවත නා හිමියන් අපවත් වූයෙන් අටමස්ථානාධිපති ධුරයට පත් වූයේ පල්ලේගම ඤාණරතන හිමියන් ය. අටමස්ථානාධිපති ඤාණරතන නාහිමියන්ගේ ඉල්ලීම පරිදි රුවන්වැලි මහා සෑයේ වැඩබලන විහාරාධිකාරි හිමියන් ලෙස මාස තුනක් පමණ බොහෝ කැපකිරීමෙන් කටයුතු කිරීමට සිරිනිවාස හිමියන්ට සිදු වූහ.

උසස් පෙළ අධ්‍යාපන කටයුතුවලට හුණුපිටිය ගංගාරාමයට වැඩම කළ සිරිනිවාස හිමියෝ එහි සිට අධ්‍යාපන කටයුතු සිදු කරන අතර අටමස්ථානාධිපති ඤාණරතන නා හිමියන්ගේ ඉල්ලීමකට අනුව බෝමලුව විහාරයේ නිත්‍ය වාසය සඳහා වැඩම කළහ.

පැවිදි බිමට පත් සිරිනිවාස කුඩා ස්වාමීන් වහන්සේගේ ජීවිතයේ පළමු වැනි සදානුස්මරණීය සිදුවීම වූයේ ජය ශ්‍රී මහා බෝ හාමුදුරුවන්ගේ පළමු රන්වැටේ ප්‍රථම රන් කණුව ස්ථාපනය කිරීමේ අවස්ථාවේ සෙත්පිරිත් සජ්ඣායනා කිරීමේ පුණ්‍යවන්ත වරම ලැබීම ය.

බෝමලුව විහාරයට වැඩම කිරීමත් සමඟ ම දිනපතා උදේ, සවස ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීමේ දුර්ලභ වාසනාව හිමි විය. අධ්‍යාපන කටයුතු නිම කිරීමෙන් පසු ජය ශ්‍රී මහා බෝධි ස්ථානයට පැමිණි උන්වහන්සේ ටික කලක් එහි වැඩමවීමෙන් පසුව, අටමස්ථානාධිපති නා හිමියන්ගේ ඉල්ලීමකට අනුව මිරිසවැටිය විහාරස්ථානයේ ද, අභයගිරි විහාරස්ථානයේ ද භාරකාරත්වය උන්වහන්සේ දැරූහ.

> **ශ්‍රී මහා බෝධින්වහන්සේ ඇතුළු අටමස්ථානයේ වර්තමාන සංවර්ධනයේ නියමුවාණන් ලෙස උන්වහන්සේ දීර්ඝ කාලයක් ඉටුකළ ලෝක ශාසනික සේවාව අගයමින් තායිලන්ත රජය මඟින් ආචාර්ය උපාධියක් ද පිරිනමනු ලැබීය.**

කලක් එහි වැඩ විසීමෙන් පසුව, අටමස්ථානාධිපති නා හිමියන්ගේ ඉල්ලීමකට අනුව මිරිසවැටිය චෛත්‍යාරාමයේ විහාරාධිකාරි ලෙස සිරිනිවාස හිමියෝ පත් කෙරිණි. වර්ෂ 1994 දී අභයගිරි චෛත්‍යාරාමයේ වැඩ විසූ පෙරිමියන්කුලමේ උපතිස්ස නා හිමියෝ අපවත් වී වදාළහ. ඒ අනුව අටමස්ථානාධිපති ඤාණරතන නා හිමියන්ගේ බලවත් ඉල්ලීමකට අනුව සිරිනිවාස හිමියන්ට අභයගිරිය චෛත්‍යාරාමයට වැඩම කිරීමට සිදු විය. උන්වහන්සේට අභයගිරි විහාරයේ වැඩ විසීමට සිදු වූයේ වසරක පමණ කාලයකි.

1995 වර්ෂයේ දී රුවන්වැලි මහා සෑයේ විහාරාධිකාරීව වැඩ විසූ ඇතිනිමලේ ගුණරතන නා හිමියෝ අපවත් වී වදාළහ. ඉන් අනතුරුව අටමස්ථානාධිපති නා හිමියන් විසින් සිරිනිවාස හිමියන් රුවන්වැලි මහා චෛත්‍යය රාමාධිකාරි ධුරයට පත් කරන ලදී.

වර්ෂ 1995 දී මහත් ගෞරව බහුමානයෙන් මල්වතු මහා විහාර පාර්ශ්වයේ කාරක සංඝ සභාව විසින් සිරිනිවාස හිමියන් උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක පදවියට පත් කෙරුණි. මෙම පදවිය ලැබීමත් සමඟ ම පල්ලේගම සිරිනිවාස හිමියෝ පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරිනිවාස නා හිමි නම් වූහ.

පල්ලේගම ඤාණරතන අටමස්ථානාධිපති නාහිමියන්ගේ අපවත්වීමෙන් පසු අටමස්ථානාධිපති ධුරයට සුදුසු ස්වාමීන් වහන්සේ වූයේ සිරිනිවාස නාහිමියන් ය. 44 වැනි වියෙහි පසු වූ සිරිනිවාස නා හිමියන් අටමස්ථාන කාරක සභාවේ අවසන් තීරණයෙන් පසු ඉතිහාසයේ එම උත්තරීතර පදවියට පත් වූ ළාබාලම භික්ෂූන් වහන්සේ බවට පත්වූහ.

පෙර රජ දවසින් පසු වර්තමානයේ ජය ශ්‍රී මහා බෝධි මලුවේ දක්නට ලැබෙන සියලු ඉදිකිරීම් සහ නිර්මාණ අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස නා හිමියන්ගේ සංකල්පනාවන් අනුව සිදු වූ ඒවා බව සඳහන් කළ යුතුව ඇත.

අටමස්ථානය සිංහල බෞද්ධයන්ගේ මුදුන්මල්කඩ වන් අතිපූජනීය සිද්ධස්ථාන අටකි. එම අටමස්ථාන බලා ගැනීමේ වගකීම ඉතා ගරු ගාම්භීර කටයුත්තකි. එම ගරු ගාම්භීර කටයුත්ත මීට පෙර අටමස්ථාන අධිපති පදවි හෙබ වූ නා හිමිවරුන් වහන්සේ සේ ම පල්ලේගම සිරිනිවාස නාහිමියන් ද ඒ වගකීම ඉතා හොඳින් ඉටු කළ යතිවරයන් වහන්සේ නමකි.

ශ්‍රී මහා බෝධින්වහන්සේ ඇතුළු අටමස්ථානයේ වර්තමාන සංවර්ධනයේ නියමුවාණන් ලෙස උන්වහන්සේ දීර්ඝ කාලයක් ඉටුකළ ලෝක ශාසනික සේවාව අගයමින් තායිලන්ත රජය මඟින් ආචාර්ය උපාධියක් ද පිරිනමනු ලැබීය.

අපවත් වී වදාළ අනුරාධපුර අටමස්ථානාධිපති, ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරි නිවාස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට උතුම් නිර්වාණ සුවය ප්‍රාර්ථනා කොට සිටිමු.

අභයගිරි විහාරාධිකාරී
අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්ය
**කල්ලංචියේ රතනසිරි හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## වප් අමාවක 2022-10-24

## තාවකාලික සතුට හා සදාකාලික දුක

ජීවිතයේ සතුට හඹා යන බොහෝ දෙනකුට අවසානයේ උරුම වන්නේ තාවකාලික සතුට හා සදාකාලික දුක ය. ඒ තැනට වැටෙන්නේ ජීවිතයේ ඇත්ත අවබෝධ කර නොගැනීම හා දහමට අනුව ජීවිතය පවත්වා ගැනීමට උත්සාහ නොවීම තුළ ය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය තුළ අපට අවධාරණය කොට තිබෙන්නේ, අනුශාසනා කරන්නේ සතුටින් ජීවත්වන මඟ ය. එහෙත් අප බොහෝ දෙනකුට සතුට දුර ය. නුදුරේ ම සතුට ඇතැයි පෙනුණ ද මිරිඟුව සේ එය දුරස්ථ ය. ළඟා වීමක් නොමැති තරම් ය.

බුදුරජාණන් වහන්සේ ගිහියාට අනුදැන වදාළ පංච ශීල ප්‍රතිපදාව තුළ ම ලැබෙන සතුට අපමණ ය. පරපණ නැසීමෙන් වැළකීම තුළ ම සුරැකෙන්නේ තමාගේ ම ජීවිතයේ සුරක්ෂිත බව ය. මම කිසිදු විටෙක, කිසිදු හේතුවක් නිසා අන්සතු ජීවිතයක් විනාශ නොකළෙමි යන සතුට මිල කළ නොහැකි ය.

තමන්ගේ දෙයක් අන්සතු වුවහොත් දැනෙන දුක, වේදනාව මොනතරම් ද? තමන්ට සේ ම අන්‍යයන්ට ද එය එසේ ම ය. අන්සතු දේ සොරකමින් වැළකීම තුළ සුරක්ෂිත වන්නේ තමන් සතු දෙයෙහි ආරක්ෂිත බව ය. කොපමණ අසරණ තැනකට වැටුණේ වුව ද අන් සතු දෙය සොරකම් නොකළෙමි. කිසිවකුට වංචා නොකළෙමි. මම මගේ ජීවන වෘත්තියට වංචා නොකළෙමි. ආදී ලෙස ලැබෙන සතුට තාවකාලික සුවයක් නොවේ. ඒ සතුට සදාකාලික ය.

කාමය වරදවා හැසිරීම, බොරුව, රහමෙර පානය ආදි දුරාචාරයන්ගෙන් වෙන්වීම ද සදාකාලික සතුට ලැබෙන මඟකි. මේ ජීවිතය තුළ මම පස්පවින් දුරුවුණෙමි යන ආත්මාභිමානී සිතිවිල්ල සමාජය ඉදිරියේ දී ද අභිමානයකි. බෞද්ධයකු නම් ඒ අභිමානය තිබිය යුතු ම ය.

භෞතික ජීවිතයේ සතුට සොයා යන කෙනකුට අණන සූත්‍රය සුවිශේෂී ය. එහි සතුට ලැබෙන සැප හතරක් ගැන කියැවේ. ඒ අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ හා අනවජ්ජ සුඛය යි.

කෙනකුට අත නොපා ජීවත්වීමට හැකිනම් ඒ ජීවිතය ගෞරවණීය ය. අනුන් ඉදිරියේ හිස නොනැමෙන්නකි. එසේ තමන්ගේ ජීවිතය, තම අඹුදරුවන්ගේ ජීවිතය දුෂ්කරතාවකින් තොරව පවත්වා ගැනීමට හැකි ලෙස භෞතික සම්පත් කළමණාකරණය කර ගත් පුද්ගලයාට අත්ථි සුඛය ලැබේ.

ඇතැම් අය මොන තරම් හරිහම්බ කළ ද ඒ සියල්ල තම පරිභෝජනයට පමණි. බෙදාහදා ගන්නට නො දනී. ඒ තුළ සතුටක් නැත. සතුට ලැබෙන්නට නම් තමන් සතු දෑ බෙදා හදා ගනිමින් පරිභෝජනය කළ යුතු ය. තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටුකළ යුතු ය. ඒ තුළ ලැබෙන තෘප්තිය භෝග සුඛය යි.

අණන සුඛය නම් ණය නැති බව ය. තමන් හැදූ වැඩූ මව්පියන්ගේ සිට, පවුලට, ගමට, රටට, ජාතියට, ආගමට මේ පරිසරයට ණයකරුවකු නොවන ලෙස ජීවත්වන පුද්ගලයාට යි. ඒ සතුට ලැබෙනුයේ.

යහපත් දේ සිදු කළොත් ලැබෙන්නේ යහපත් ප්‍රතිපලයකි. අයහපතෙහි විපාකය අයහපත ම ය. බෞද්ධයා නම් අනිවාර්යයෙන් ම කර්මපල විශ්වාස කරන්නෙක් විය යුතු ය. ඒ විශ්වාසයෙන්, නරකින් ඉවත්ව නිවැරැදි ජීවන පැවැත්මක් සකසා ගැනීම තුළ ලබන සතුට, සුවය අනවජ්ජ සුඛය යි.

මෙලෙස භෞතිකව සතුටු වන පුද්ගලයා ආධ්‍යාත්මික ව ද තම සිතිවිලි කළමණාකරණය කර ගත යුතු ය. වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, ලෝභය, මෝහය ආදී කෙලෙස් සිතිවිලි වැඩෙන්නට, වැඩෙන්නට වර්ධනය වන්නේ දුක ය.

එම කෙලෙස් මුල්වීම නිසා සිදුකරන අවසාන පලය ගැන කෙනෙක් යම් මොහොතකට වියරු සතුටක් ලබනවා විය හැකි ය. එහෙත් සදාකාලික ව ඔහු පසුපස එන්නේ දුක ය. තාවකාලික සතුට ලැබ සදාකාලික දුක උරුම කර ගන්නවා ද? තෝරා ගැනීම තම තමන් සතු ය.

# විද්‍යාලංකාර සම්ප්‍රදායේ වර්තමාන භූමිකාව

**එවකට රත්මලාන පුරාණ විහාරය ඇතුළු විද්‍යාලංකාර පිරුවන සතු සියලු ස්ථානයන්හි නීත්‍යනුකූල ප්‍රධාන අධිකාරී බලය හිමිව සිටි විද්‍යාලංකාර පරිවේණාධිපති, සාර්වභෞම පණ්ඩිත යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නායක ස්වාමීන් වහන්සේ එම ස්ථානයෙහි නීත්‍යනුකූල අයිතියක් තමන්වහන්සේට හැර වෙනත් කිසිවකුට නැති බව මැනවින් පෙන්වා දී ඇති අතර, මේ පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් අපේ මල්වතු මහා විහාරයේ ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ සානුනායක කාරක මහා සංඝ සභාව වෙත ලියා දැනුවත් කර ඇති බව කිව යුතු ය.**

රත්මලාන පුරාණ විහාරය සම්බන්ධ ව මතුවූ එම ප්‍රශ්නය විසඳීම සඳහා මල්වතු මහා විහාරය යක්කඩුවේ නායක ස්වාමීන් වහන්සේ විසින් යවන ලද සවිස්තරාත්මක ලිපිය විශේෂ අවධානයට ගෙන තීන්දුවක් දී ඇත. එම තීන්දුවෙහි මෙසේ සඳහන්ව ඇත.

"විත්තිකාර ස්ථවිර තැන" වැටහෙන යුක්තියක් ඉටු කරන ලෙස" 1972.11.23 දින දරන ලියමන 1972.12.02 දින අප වෙත ලැබෙන්නට සලස්වා විභාගයට නොපැමිණියේ ය. පැමිණිලි පක්ෂය විභාගය සඳහා පැමිණියේ ය.

මේ පිළිබඳ සෑහෙන කාලයක් ගතවීමත්, විත්තියේ ඉල්ලීම අනුව දින දීමත් සිදු වූ නමුත් විත්තිකාර ස්ථවිර තැන අන්තිමට එවූ ලියමනේ සඳහන් වන ලෙස විභාගයට ඉදිරිපත් නොවන බව ඒත්තු ගිය බැවින්, ලැබී තිබෙන ලියුම් කියවා බලා ඒ අනුව තීන්දුවක් කිරීමට සභා සම්මත විය.

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්ථවිරයන් වහන්සේගේ කාලයේ දී එම තත්ත්වය නිරවුල් ව පැවැති බව පෙනේ. එම සම්මුතිය හා සම්ප්‍රදාය අනුව යථොක්ත විද්‍යාලංකාර පිරිවෙනේ අධිපතිධුරය දරන යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නායක ස්ථවිරයන්ට මෙම රත්මලානේ පුරාණ විහාරස්ථානයේ ප්‍රධාන අධිකාරීධුරය ද හිමි විය යුතු බැවින්, නායක ස්ථවිරයන් වහන්සේ මෙම පෙත්සමේ විත්ති පැමිණිලි දෙපක්ෂය ඇතුළු කිරිගල්පොත්තේ ශ්‍රී ඉන්දජෝති නායක ස්ථවිරයන් වහන්සේගේ සියලුම ශිෂ්‍යයන් යථෝක්ත විද්‍යාලංකාර පරිවෙණාධිපති යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නායක ස්ථවිරයන්ගේ අවවාද අනුශාසනා හොඳින් පිළිගෙන ස්ථානයේ අභිවෘද්ධියත්, දායකවරුන්ගේ ශ්‍රද්ධාවත් දියුණු වන ලෙස ශාසනානුලෝමිකව කටයුතු කළ යුතු බව ද නියම කරන්ට යෙදුණා ඇත.

මල්වතු මහා විහාරයේ අනුනායක කාරක මහා සංඝ සභාවේ සමානඡන්දයෙන් කළ මෙම තීන්දුව පිළිගෙන ස්ථිර කළ බවට, ඒ වගත් මෙසේ ම, මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති මඩුගල්ලේ ශ්‍රී සුමන සිද්ධාර්ථ ධම්මසිද්ධ්‍යාභිධාන මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මහා නායක ස්ථවිරයන් වහන්සේ වම්හ. අත්සන් කළේ මඩුගල්ලේ ශ්‍රී ධම්මසිද්ධි හිමි 2516 1972 දෙසැම්බර් 4 වැනි දින මහනුවර මල්වතු මහා විහාරයේ දී ය. (මේ තීන්දුව දායක සභාව විසින් ඉතා ගෞරවයෙන් පිළිගනු ලැබීය)

ඉන් අනතුරුව යක්කඩුවේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා ඇතිව රත්මලාන පුරාණ විහාරයේ කටයුතු පවත්වාගෙන යන ලදී. මාදම්පේ අත්ථදස්සී ස්වාමීන් වහන්සේ, කොටනෙළුවේ චන්ද්‍රජෝති ස්වාමීන් වහන්සේ, ඇලිකේවල ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රධාන ව එම විහාරස්ථානයේ කුදුමහත් ආගමික කටයුතු ඉදිරියට පවත්වා ගෙන ආ බව කාටත් පැහැදිලි ය.

සාර්වභෞම පණ්ඩිත යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නායක ස්වාමීන් වහන්සේගේ අපවත්වීමෙන් පසු පිළිවෙළින් විනයාචාර්ය නාත්තන්ඩියේ ශ්‍රී ප්‍රඥාකර කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන් වහන්සේ, ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරය හෙබවූහ.

විද්‍යාලංකාර සම්ප්‍රදායට අනුව උන්වහන්සේ ද පිරුවන සතු සියලු ස්ථානයන්හි භාරකාරත්වයට නිතැතින් ම පත්විය. වර්ෂ 2002 පෙබරවාරි මස 02 වැනි දා ඇලිකේවල ආනන්ද ස්වාමීන් වහන්සේගේ අපවත්වීමෙන් පසුව එවකට පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේණාධිපති හා අධ්‍යක්ෂ ආචාර්ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා ඇතිව හෙවෙස්සේ නන්දාරාම ස්වාමීන් වහන්සේ අනෙකුත් විහාරවාසී ස්වාමීන් වහන්සේගේ පූර්ණ සහාය ඇතිව රත්මලාන පුරාණ විහාරය තදනුබද්ධ සියලු කාර්යයන් නොපිරිහෙළා මේ දක්වා ම සිදු කර ගෙන එනු ලබයි.

වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ අපවත්වීමෙන් පසුව විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරය සඳහා නාවින්නේ ධර්මකීර්ති ශ්‍රී සුගුණධම්ම කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන් වහන්සේ පත්වුව ද උන්වහන්සේ ටික කලකින් අපවත් වූයෙන් විද්‍යාලංකාර පරිවේණාධිපති ධුරයට විද්‍යාලංකාර උප පරිවේණාධිපති හා අධ්‍යක්ෂ වැලමිටියාවේ කීර්ති ශ්‍රී ඤාණරතන නායක ස්වාමීන් වහන්සේ විද්‍යාලංකාර සභාව විසින් පත් කරන ලදි.

විද්‍යාලංකාර සම්ප්‍රදායට අනුව උන්වහන්සේට ද පිරුවන සතු සියලු ස්ථානයන්හි භාරකාරත්වය නිතැතින්ම හිමි ය. එය අණබෙර ගසා, පුවත්පත් දැන්වීම්වල පළකරවා ප්‍රසිද්ධ කළ යුතු නැත. එවැනි අතීත සම්ප්‍රදායක් විද්‍යාලංකාර පිරුවන සතුව තිබුණේ ද නැත. විද්‍යාලංකාර පිරුවනේ මාතෘ භූමිය වූ රත්මලාන පුරාණ විහාරය සම්බන්ධ ව කතිකාව එපමණයි.

අතීත විද්‍යාලංකාර සම්ප්‍රදායට අනුගතව යමින් විද්‍යාලංකාර පිරුවනේ මාතෘභූමිය වූ රත්මලාන පුරාණ විහාරයෙහි වර්තමාන විහාරාධිපතිකමට විද්‍යාලංකාර පරිවේණාධිපති හා අධ්‍යක්ෂ වැලමිටියාවේ කීර්ති ශ්‍රී ඤාණරතන කොළඹ හලාවත දෙදිසාවේ උප ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපේ මල්වතු මහාවිහාරයේ ශ්‍රීමත් මහා නායක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ සානුනායක කාරක මහා සංඝ සභාව විසින් පත්කොට තිබේ. එය පුදුමයට හෝ කලබලයකට හෝ කිසිවෙක් පත් විය යුතු කරුණක් නොවේ. කලබලයකට මෙන්ම පුදුමයට පත් පිරිසක් වෙතොත් ඒ අයගේත් මතු අයගේත් දැනගැනීම පිණිස මෙම කරුණු ගොනු කෙරුවා මිස එම පත්කිරීම ප්‍රසිද්ධ කිරීමට අපට විද්‍යාලංකාරිකයන්ට කිසිසේත්ම අවශ්‍ය නැත.

'පරත්ථං පටිපජ්ජථ' යන බුදු වදනට අනුව අපි කොයි කවුරුත් අන්‍යයන් වෙනුවෙන් එකමුතුව එකාවන් ව යමක් කැපවීමෙන් සිදුකරමු. ඒ විද්‍යාලංකාර සම්ප්‍රදායෙහි වර්තමාන භූමිකාවයි.

(පොත පත ඇසුරින් හා විශේෂයෙන්ම යක්කඩුවේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අත්පිටපත්වලින් ලබා ගත් තොරතුරු ඇසුරින් සැකසුණි)

***මෙම ලිපියේ මුල් කොටස් වප්පුර පෝද (09) පත්‍රයේ සහ එතැන් සිට බුදුසරණ අන්තර්ජාල කලාපයන්හි පළවුණි.***

විද්‍යාලංකාර සභාවේ සමලේකම්
**උඩගලදෙණියේ ධම්මවිමල හිමි**

# හදිසි තීරණ අපරීක්ෂාකාරී බව

# විනාශයේ ඇරඹුමයි



අනුරාධපුර ලංකාරාමාධිකාරි
උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන
අධිකරණ සංඝනායක
**රැළපනාවේ ධම්මජෝති හිමි**

**'පඤ්ඤා නරානං රතනං' මේ ලෝකයේ මිනිසුන්ට ඇති උතුම්ම රත්නය ඥානය යි. මේ ඥානයෙන් ප්‍රයෝජන ගැනීම තම තමන්ගේ වගකීම ය. මවුපියන්ගෙන්, ගුරුවරුන්ගෙන්, වැඩිහිටියන්ගෙන් ලැබෙන ගුරුහරුකම්, අවවාද, අනුශාසනා නිසා මේ ඥානය වඩා වර්ධනය කර ගත හැක.**

සියුම් "නිර්වාණය" පවා අවබෝධ වන්නේ දියුණු කර ගත් "මනුෂ්‍ය ඥානයට යි" සෑම මනුෂ්‍යයකුට ම හොඳ නොහොඳ තේරුම් ගැනීමට පුළුවන් හැකියාවක්, ඥානයක් තිබිය යුතු ය. නොඑසේ නම් ඔහු නිතර ම අමාරුවේ වැටේ. මෙබඳු අය මන්ද බුද්ධික උම්මත්තකයින් බඳු ය.

උම්මත්තකයකුට නිවැරැදි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් නැත. සිතුවේ යමක් ද එයම කරයි. එලෙසම කියයි. එනිසා අපි නොකළ යුතු දේ නොකර සිටීමටත්, කළ යුතු යමක් ඇත්නම් එය කිරීමටත් වග බලා ගත යුතු ය. එවිට සිදු වන්නේ යහපතක් ම ය.

ඉක්මන, හදිසිය, කලබලය, අපරීක්ෂාකාරීත්වය, විනාශයට එක්තරා හේතුවකි. සමහරු තම දරුවන් සමඟින් රිය අනතුරුවලට භාජනය වන්නේ අපරීක්ෂාකාරී රිය ධාවනය නිසයි. තවත් සමහරු තැන නොතැන නොබලා කරන ජංගම දුරකථන සංවාද අනතුරු කැඳවන්නක්. සමහරු මහමඟ මන්තීරු මාරුවීම්වල දී දෙපස නොබලා ගමන් කිරීම නිසා වන විනාශ බොහෝ ය. නුහුරු ගැඹුරු ජලාශවල නෑම, විදුලි උපකරණ භාවිතය වැනි අවස්ථාවල දී සිදුවන බොහෝ අනතුරුවලට මූලික හේතුව අපරීක්ෂාකාරීත්වය යි. එබැවින් හැම කටයුත්තක දී ම අපරීක්ෂාකාරී බවෙන් මිදී පරීක්ෂාකාරීව කටයුතු කිරීමට මහන්සි ගත යුතු ය.

අපරීක්ෂාකාරී පුද්ගලයන් හැම විටම පසුතැවිල්ලෙනුත්, සුපරීක්ෂාකාරී පුද්ගලයන් හැම විටම සතුටිනුත් ජීවත් වෙයි. ජනවහරේ මෙවැනි කියමනක් ඇත.

අප යන එන විට, නිදන විට, කන බොන විට, අඳින පළඳින විට, කියන මේ සෑම අවස්ථාවක ම කල්පනාකාරීව ම කටයුතු කර ගත යුතු ය. නැතිනම් සුළු ප්‍රමාද දෝෂයකින් පවා ජීවිතයෙන් වන්දි ගෙවීමට පවා සිදු වේ. දහමෙහි සතියෙහි පිහිටා කටයුතු කර ගත යුතු යැයි උගන්වා ඇත්තේ මෙබඳු විපත්වලින් අත මිදීමටත්, නිවනටත් හේතුවන නිසයි.



**උම්මන්තකයකුට නිවැරැදි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් නැත. සිතුවේ යමක් ද එයම කරයි. එලෙසම කියයි. එනිසා අපි නොකළ යුතු දේ නොකර සිටීමටත්, කළ යුතු යමක් ඇත්නම් එය කිරීමටත් වග බලා ගත යුතු ය. එවිට සිදු වන්නේ යහපතක් ම ය.**

අපරීක්ෂාකාරීත්වයත්, සැකයත් නිසා කාන්තාවක් මුහුණ පෑ දුක්මුසු සිදුවීමක් ගැන කියැවෙන කතාවක් ජනවහරේ ඇත.

පෙර එක්තරා බමුණු ගමක "දේව ශර්ම" නම් වූ දුප්පත් බමුණෙක් හිටියා. මොහුගේ භාර්යාව පුතකු වැදුවා. එදාම මුගටි පැටියකු වදා මුගටිදෙන මැරුණා. බැමිණිය අසරණ වූ මෙම මුගටි පැටියා අහක නොදමා තමන්ගේ ම තනකිරි දී පෝෂණය කළා. බැමිණිය මෙසේ කළත් කවදා හෝ තම දරුවාට මුගටියාගෙන් විපතක් සිදුවෙයි යන සැකයෙන් ම හිටියා. එක දවසක් ඇය දරුවා යහනෙහි නිදි කරවා කළය රැගෙන තම ස්වාමියාට කතා කොට ස්වාමීනි, මම වතුර ගෙනෙන්නට යනවා. එබැවින් දරුවා බලා ගන්නට යැයි කියා ගියා.

බැමිණිය ගිය පසු ධනවත් සත්පුරුෂයෙක් 'දුප්පතුන්ට ධනය දෙයි' යන ආරංචිය ලැබී දරුවා ළඟ මුගටියා තබා භාර්යාව පැමිණීමට කලින් ඉක්මනින් එමි'යි සිතා බමුණා බැහැරට ගියා. මේ අතරතුර ගෙට සර්පයෙක් පැමිණියා. ඒ නාගයෙක්. උපතින් ම නාගයා මුගටියා සමඟ විරුද්ධ යි. මුගටියා නාගයා දැක වහා මරා දැම්මා. බැමිණිය වතුර කළය රැගෙන එන විට මුගටියා නයා මැරීමේ සතුට බැමිණියට කීමට මෙන් ඉදිරියට ආවා. ලේ තැවරුන මුහුණෙන් ඉදිරියට ගිය මුගටියාට සිදු වූයේ අකරතැබ්බයක්. නිතරම මුගටියා ගැන සැකෙන් හිටිය කාන්තාව ලේ තැවැරුණ මුගටියා දුටු සැණින් තම දරුවා මුගටියා විසින් කා දමා ඇතැයි සිතා අතෙහි තිබූ වතුර කළයෙන් ම ගසා මුගටියා මරා දැම්මා. මරා ගෙට ගිය ඇය දරුවා සිටින තැනට ගොස් බලන විට දරුවා හොඳින් සිටින බවත්, නාගයා මැරී ඇති බවත් දැක්කා. සිදු වූ කාරණය පසුව තේරුම් ගත් බැමිණිය තමන් පරීක්ෂා නොකොට කළ ක්‍රියාව ගැන පසුතැවීමටත්, බලවත් ශෝකයටත් පත් වුණා.

මේ කාරණය ද සිතෙහි තබා බුදුරජාණන් වහන්සේ කළ යුතු, නොකළ යුතු කරුණු වශයෙන් පෙන්වා වදාළේ කුමක්දැයි සිතා බලමු.

දවසක් දා ආනන්ද හාමුදුරුවන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියා. ආනන්ද හාමුදුරුවන් වහන්සේට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළා.

ආනන්ද, මම කයින් කෙරෙන දුෂ්චරිත, වචනයෙන් කෙරෙන දුෂ්චරිත, සිතින් කෙරෙන දුෂ්චරිත නොකළ යුතු යැයි කියමි.

එවිට ආනන්ද හිමි ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, යම් සේ කාය දුෂ්චරිත, වචී දුෂ'චරිත මනෝ දුෂ් චරිතයන් නොකට යුතු බව දේශනා කළා.

ස්වාමීණි ඒ නොකටයුතු දුෂ්චරිත කරන්නාට ලැබෙන විපාක තිබේද? එසේ නම් එය දැන ගැනීමට කැමැත්තෙමියි විමසී ය. එවිට බුදුරජාණන් වහන්සේ දුෂ්චරිත කරන පුද්ගලයාට ලැබෙන විපාක වශයෙන් පහත සඳහන් කරුණු පෙන්වා වදාළහ.

- තමන්ට තෙමේ ම දොස් කියයි.
- නුවණැත්තෝ ඔහුට නින්දා කරති.
- නරක රාවයක් පැන නඟී.
- සිහි නැතිව සිට කලුරිය කරයි.
- මරණින් මතු දුගතියක උපදී යනුවෙනි.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමි අමතා ආනන්ද ය, කාය සුචරිත, වචී සුචරිත, මනෝ සුචරිත කළ යුතු යැයි මම කියමි'යි කීහ. එවිට ආනන්ද හිමි, භාග්‍යවතුන් වහන්ස, ඒ සුචරිතයන් කරන අයට ලැබෙන විපාක ඇත්නම් එය ද දැන ගැනීමට කැමැත්තෙමි'යි කී සේක. එවිට බුදුරජාණන් වහනසේ ආනන්දය සුචරිතයන් කරන පුද්ගලයාට පහත සඳහන් විපාක ලැබෙන බව කියා දුන්හ. එනම්,

- තමන්ට තෙමේ ම දොස් නොකියයි.
- නුවණැත්තෝ ප්‍රශංසා කරති.
- හොඳ කීර්තියක් පතළ වෙයි.
- සිහි නුවණින් යෙදී කලුරිය කරයි.
- මරණින් මතු දිව්‍ය ලෝකයේ උපදියි යනුවෙනි.

එනිසා පින්වතුනි, අප ද දෛනිකව කරනු ලබන කටයුතුවල දී කළ යුතු, නොකළ යුතු දේ තෝරා බේරා ගෙන කල්පනාකාරීවත්, සුපරීක්ෂාකාරීවත් කටයුතු කිරීමට උත්සාහ දරමු. එවිට පසුතැවිලි නොවී සතුටින් ජීවත් වීමට අවස්ථාව ලැබෙනු ඇති.



# දෙව්ලොව දෙව්වරු ද පින් කුසල් රැස් කරති

**මහා කාරුණික අප භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සත්ථා දේවමනුස්සානං ගුණයෙන් යුක්ත යි. උන්වහන්සේ දෙවියන්ට, මිනිසුන්ට, බ්‍රහ්මයන්ට අනුශාසනා කරන හෙයින් ද, සසර දුකෙන් අත්මිදීමට මාර්ගය කියාදෙන බැවින් ද, ඒ සියලු දෙනාගේ ශාස්තෘන් වහන්සේ වන සේක.**

උන්වහන්සේ හැර නිවන පිණිස දහම් දෙසන වෙනත් ශාස්තෘන් වහන්සේ නමක් අපට හමු නොවේ. උන්වහන්සේ මිනිස් ලොව වැඩ හිඳිමින් දෙව්ලොව සමඟ සෘජු සම්බන්ධකම් පැවැත් වූ ශාස්තෘන් වහන්සේ නමක්. උන්වහන්සේ මිනිසුන් මෙන්ම දෙවියන් කෙරෙහි ද, අනුකම්පාවෙන් ධර්මය දේශනා කළ අතර ඒ ධර්මය ශ්‍රවණය කිරීමෙන් මිනිසුන් මෙන්ම දෙවියන් ද සසර දුකෙන් එතෙර වුණා.

දේවතා සංයුත්තයේ සඳහන් වන ආකාරයට දෙවියන් තීක්ෂණ බුද්ධියකින් යුතු බව පැහැදිලි වෙනවා. ඔවුන් බුද්ධ ශාසනයට මහත් සේ ගරු කළ ආකාරයත්, ඔවුන්ගේ ශ්‍රද්ධාවත් දේවතා සංයුත්තයෙන් ප්‍රකට වෙනවා.

දේවතා සංයුත්තයේ නින්දාතන්දී සූත්‍රයේ දී එක් දෙවියෙක් තථාගතයන් වහන්සේ වෙත පැමිණ අසා සිටිනවා. "භාග්‍යවතුන් වහන්ස, නින්ද, බත්මත, ඇඟමැලි කැඩීම, කුසල් දහමට ඇති අරතිය (ධර්මයට ඇති අකැමැත්ත) ආදී දේ තුළින් මනුෂ්‍යයාගේ ආර්ය මාර්ගය ප්‍රකට වන්නේ නෑ නේද? කියලා.

එහිදී භාග්‍යවතුන් වහන්සේ වදාළා. "දේව පුත්‍රය, නින්ද, කම්මැලිකම, ඇඟමැලි කැඩීම, ධර්මයේ නො ඇලීම, බත්මත ආදිය දුරුකළ යුත්තේ වීර්යයෙනි. වීර්ය දියුණු කළ පුද්ගලයාට ආර්ය මාර්ගය පිරිසුදු වන්නේ ය.

තවත් දිනෙක දෙව් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ කියා සිටිනවා. භාග්‍යවතුන් වහන්ස, බාලයාට, අඥාන පුද්ගලයාට මහණදම් පුරන්න බැහැ. එය ඔහුට ඉවසන්නත් බැහැ කියා.

එවිට භාග්‍යවතුන් වහන්සේ වදාළා

දේවපුත්‍රය, සිත වරදින් වළකින්නේ නැතිනම් කී දවසක් මහණදම් කරන්න ද? පාපී විතර්කයන්ට වසඟව පියවරක්, පියවරක් පාසා අරමුණක් අරමුණක් පාසා ඔහු පසුබසිනවා.

ඉදිබුවා තම අවයවයන් සිය කබල තුළ බහාලන්නාක් මෙන් යම් භික්ෂුවක් විතර්කයන් ප්‍රහාණය කරමින්, අනුන් නොවෙහෙසා වාසය කරන විට ඒ භික්ෂුවට මේ ධර්මය අවබෝධ කර ගත හැකි වනවා.

"අරහන්ත සූත්‍රයේ" දී එක් දෙවියෙක්

> **"නිදුකාණන් වහන්ස, දන්දීම කෙතරම් හොඳ දෙයක් ද? බොහෝ අය මසුරුකමත්, ප්‍රමාදයත් නිසා දන් දෙන්නේ නැහැ. ටිකක් තිබෙද්දී දෙන දනය මහා දනයක් තරම් වටිනවා. දන්දීම හොඳයි. ටිකක් තිබෙද්දී දීම වඩාත් හොඳයි. එහෙත් භාග්‍යවතුන් වහන්ස, ශ්‍රද්ධාවෙන් දන්දීම ඉතාමත් හොඳයි.**
> **ස්වාමීන් වහන්ස, දන් දීම, යුද්ධයක් කරනවා වගේ වැඩක්. බොහෝ මසුරු පුද්ගලයන් පරදවා සුළු දෙනෙක් තමා ශ්‍රද්ධාවෙන් දන් දෙන්නේ. ඔවුන්ට පරලොව සැප ලැබෙනවා යැයි කියා සිටියා.**

අසනවා ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, චතුරාර්ය සත්‍ය අවබෝධය, මාර්ගඵල අවබෝධය ඇති කරගෙන ආශ්‍රවයන් ක්ෂය කළ රහතන් වහන්සේ සිටිනවා. ඒ රහතන් වහන්සේ "මම" කියාත් "මට" කියාත් යම් යම් හේතුන් නිසා කියනවා. ඒ කියමන හරිද කියායි ඒ දෙවියා ඇසුවේ.

එවිට භාග්‍යවතුන් වහන්සේ වදාළා,

ඒක ඇත්ත දේවපුත්‍රය. අන්තිම ශරීරය දරා සිටින නිකෙලෙස් වූ රහතන් වහන්සේ සිටිනවා. ඒ රහතන් වහන්සේ "මම" කියා කියනවා. "මට" කියා කියනවා. එයට හේතුව උන්වහන්සේ මේ ලෝක ව්‍යවහාර පිළිබඳ දක්ෂ වීම, එවිට ඒ දෙවියා අසනවා.

"භාග්‍යවතුන් වහන්ස, ඒ රහතන් වහන්සේලා මම කියමි, මට කියමි කියා කියන්නේ මාන්නයකින් නොවේ ද?

දේවේන්ද්‍රය, මාන්නය ප්‍රහාණය කළ රහතන් වහන්සේ මාන්නයට ගැට ගැහෙන ස්වභාවයක් නැහැ. උන්වහන්සේ සියලු මාන ගැට ප්‍රහාණය කරලයි සිටින්නේ. සියලු හැඟීම් ඉක්මවා ගොස් තිබෙන්නේ. එනිසා රහතන් වහන්සේ මම, මට ආදී දේ කියන්නේ ලෝක ව්‍යවහාරයෙන් විතරයි. සාමාන්‍ය සමාජයේ මනුෂ්‍යයින් "මම" කියන වචනයට බය වෙලා තිබෙනවා. ඔය බිය නිසා තමයි අර්බුද හට ගන්නේ.

"සර සූත්‍රයේ" දී එක දෙව් කෙනෙක් ඇසුවා භාග්‍යවතුන් වහන්ස, මේ සැඩපහර නවතින්නේ කොතැනින්ද? සසර ගමනට සසර සුළියට හසු නොවී ඉන්නේ කොහොම ද? නාමරූප ඉතිරි නැතිව නිරුද්ධ වන්නේ කොහිදී ද?

දේවේන්ද්‍රය, යම් තැනක පඨවි, ආපෝ, තේජෝ, වායෝ නොපිහිටයි ද, එතැන තමා සසර ගමන නවතින්නේ. එතැන තමා සංසාර සුළිය කැරකෙන්නේ නැතිව යන්නේ. එතැනයි නාමරූප ඉතිරි නැතුව නිරුද්ධ වන්නේ.

"මහද්ධන සූත්‍රයේ දී" එක් දෙවියෙක් අසනවා ස්වාමීනී, මහබල ඇති, මහත් ධනය ඇති, ක්ෂත්‍රීය රජවරු ඉන්නවා. ඔවුන් කාමය නිසා සෑහීමකට පත්වන්නේ නැහැ. නැවත නැවත ඔවුන් කාම සැපය ම ප්‍රාර්ථනා කරනවා.

මේ ලෝකයේ බොහෝ දෙනා කාමයන් ම ප්‍රාර්ථනා කරමින් වාසය කරද්දී භව සැඩ පහරට හසු වී ලෝකයේ කාමයට හසු නොවී වාසය කරන්නේ කවුද? භාග්‍යවතුන් වහන්සේ වදාළා ගිහිගෙය අතහැර, අඹු දරුවන් රන්, රිදී, මුතු, මැණික් අතහැර රාග, ද්වේෂ, මෝහය, අවිද්‍යාව ප්‍රහාණය කළ රහතන් වහන්සේ මේ ලෝකයේ ඉන්නවා. උන්වහන්සේ කාමය සෙවීමේ කිසිදු උත්සාහයක් නැතිවයි ඉන්නේ.

තව දෙව් කෙනෙක් පෙනී සිට භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ අසා සිටියා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අත් දෙකත්, කකුල් දෙකත් තිබෙන රෝද හතරක් වගේ තමයි මේ ශරීරය තිබෙන්නේ. අසුචියෙන් පිරී තිබෙන මේ ශරීරයට දොරටු නවයකුත් තිබෙනවා.

ලෝභයෙන් යුක්ත මේ ශරීරය මවුකුස නමැති මඩේ උපන් දෙයක්. භාග්‍යවතුන් වහන්ස, මෙවැනි ශරීරයකින් එතෙර වන්නේ කොහොම ද? බුදුරජාණන් වහන්සේ වදාළා

දෙවිය, රැහැනත්, වරපටත්, ලාමක ආශාවත්, ලෝභයත් සිඳ තෘෂ්ණාව සහමුලින් ම උදුරාලීමෙන් මේ ශරීරයෙන් නික්ම යාමක්, මිදීමක් වෙන්න පුළුවන් බව.

ඒ වගේම දේවතා සංයුක්තයේ "සාධු සූත්‍රයේ දී" දෙවියන් දන්දීම වර්ණනා කොට තිබෙනවා. දෙව්වරු පිරිසක් මුළු ජේතවනාරාමය ම ඒකාලෝක කරමින් භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණ මෙසේ අසා සිටියා.

"නිදුකාණන් වහන්ස, දන්දීම කෙතරම් හොඳ දෙයක් ද? බොහෝ අය මසුරුකමත්, ප්‍රමාදයත් නිසා දන් දෙන්නේ නැහැ. ටිකක් තිබෙද්දී දෙන දානය මහා දානයක් තරම් වටිනවා. දන්දීම හොඳයි. ටිකක් තිබෙද්දී ට වඩාත් හොඳයි. එහෙත් භාග්‍යවතුන් වහන්ස, ශ්‍රද්ධාවෙන් දන්දීම ඉතාමත් හොඳයි. ස්වාමීන් වහන්ස, දන් දීම, යුද්ධයක් කරනවා වගේ වැඩක්. බොහෝ මසුරු පුද්ගලයන් පරදවා සුළු දෙනෙක් තමා ශ්‍රද්ධාවෙන් දන් දෙන්නේ. ඔවුන්ට පරලොව සැප ලැබෙනවා යැයි කියා සිටියා.

එවිට තට දෙවියෙක් මෙසේ කියනවා. භාග්‍යවතුන් වහන්ස, කුමක් දුන්නා ම ද බලය දුන්නා වෙන්නේ? කුමක් දුන්නා ම ද හැඩරුව දුන්නා වෙන්නේ? කුමක් දුන්නා ම ද සැපය දුන්නා වෙන්නේ? කුමක් දුන්නා ම ද ඇස් දුන්නා වෙන්නේ? මේ සියලු දේ දෙන්නේ කුමක් දීමෙන්ද?

භාග්‍යවතුන් වහන්සේ වදාළා, දෙවිය, දන්පැන් දුන්නාමයි බලය දුන්නා වෙන්නේ. වස්ත්‍ර දුන්නාම හැඩරුව දුන්නා වෙන්නේ, යාන වාහන දුන්නාම සැප දුන්නා වෙන්නේ. ආලෝකය දුන්නාම තමා ඇස් දුන්නා වෙන්නේ.

යම්කිසි කෙනෙක් ගෙවල් දොරවල් දෙනවා නම් ඔහු හැමදේම දුන්නා වෙනවා. ඒ වගේම යම් කෙනෙක් ශ්‍රී සද්ධර්මය දෙනවා නම් ඔහු තමා අමෘතය දන් දෙන්නේ.

මේ සියලු දෙයින් අපට මනාව පැහැදිලි වෙනවා දෙව්ලොව සිටින දෙවියන් සද්ධර්මයට කොතරම් කැමැති ද කියලා. ඔවුන් ඉතාමත් බුද්ධිමත්, දෙව්වරු ද බොහෝ සේ පින් කර ගන්නා පිරිසක් බව මෙයින් පැහැදිලියි.

නයනා නිල්මිණී

# සාරධර්ම ගැන සීරුවෙන් නොසිටියොත්

## අනාගත පැවැත්ම අසීරු වේවි

**විවෘත සංවාදයකට යොමු විය යුතු තරමට මුළු මහත් සමාජය ම මානව චර්යා ධර්මවලින් පරිහානියට පත්වෙමින් ඇත. මෙබඳු දුසිල් තත්ත්වයකට සමාජය ඇදීයාම අප කාගේත් ශෝකයට හේතුවන අතර, යළිත් සමාජය සුගතිගාමී කිරීම සඳහා තවදුරටත් පමා නොවී සමාජ ශුධාරකයන් කටයුතු කිරීම යුගයේ ප්‍රබල අවශ්‍යතාවක් වී තිබේ.**



'මුදල' මුල් කරගත් විවෘත ආර්ථික රටාව මිනිසා මානව ගුණ ධර්මවලින් ඈත් කිරීමට ප්‍රබල හේතුවක් වී තිබේ. මිනිසකු ලෙස උපදින අප මිය යා යුත්තේ තිරිසනකු ලෙස නොව යහපත් සුධර්මවාදී මිනිසකු ලෙස ය. මිනිසා මිනිසත් බවෙහි රඳවා තබන්නට මානව සමාජයේ පෙර ගමන් කරුවන් වූ සඟ, වෙද, ගුරු යන තෙවැදෑරුම් පරපුර පෙරදා පුරෝගාමී විය.

මේ ත්‍රිවිධ භූමිකා තුළින් අදත් ඒ ගුණ සමුදායයන් සහ කැපකිරීම් සමාජය තුළට වහනය වන්නේ ද යනු සීරුවෙන් සලකා බැලිය යුතුව තිබේ.

පෙරදා සංඝරත්නය විසින් මානව සමාජය ධර්මානුගත කිරීමට කැපවන ලදී. උපෝසථ ශීලයෙන් හා සම්බුදු දහමින් පරිණතව, ධර්මානුගත පොත් එනම් බුත්සරණ, සසදාවත, කව්සිළුමිණ, උමංදාව, සද්ධර්ම රත්නාවලිය, සද්ධර්මාලංකාරය, ථූපවංශය, පූජාවලිය, ගුත්තිලය, දහම්සොඬකව වැනි සම්බුදු දහමින් පෝෂණය කරන ලද පොත් රචනා කොට සමාජගත කරන ලද අතර, මෙම ග්‍රන්ථ අධ්‍යාපනයට යොදා ගනිමින් අධ්‍යාපනය හරහා ජනතාව ධර්මානුගත කරන ලදී. ඒ මඟින් මානව සමාජය ධර්මානුගත විය.

අද එවැනි තත්ත්වයක් දකින්නට නැත. අධ්‍යාපනය තුළ පැවති සදහම් පොත් අධ්‍යාපනයෙන් බැහැර කරනු ලැබ කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන්නේ යැයි, සැලකෙන පොතපත අධ්‍යාපනයට ආදේශ කර ඇත.

මේ නිසා සාරධර්ම, ගුණධර්ම මානව ධර්ම සමාජයෙන් ගිලිහී ගොස් විභාග හා රැකී රක්ෂා ඉලක්ක කර ගත් අධ්‍යාපනයකට මුළුමහත් සමාජය නැඹුරු වී ඇත. මේ නිසා විලිබිය නැති, අසංවර වූ සදාචාරයෙන් ගිලිහී ගිය හිස් මිනිසුන් නිර්මාණය වන්නට විය.

හැම බෞද්ධ ගමක ම පන්සලක්, විහාරස්ථානයක් ඉදි වී සංඝරත්නය ද වැඩ වෙසෙති. රජය මඟින් මාසයේ ප්‍රධාන පෝය දා රජයේ නිවාඩු දිනයක් බවට පත්කර ඇත. එහෙත් මේ නිවාඩුව සැලකිල්ලට ගෙන විහාරයකට, පන්සලකට ගොස් දහම් ගතවීමට උනන්දු වන්නේ බෞද්ධයන්ගෙන් කීයෙන් කී දෙනා ද? පෝය දිනය නිවාඩු කිරීමෙන් බෞද්ධ ජනතාවට දහම් ගතවීමට රජය අනුබල දී ඇත. නමුත් පෝය දිනයේත් මුදල මුල්කොට කටයුතු කිරීමට ජනතාව ඇබ්බැහි වී ඇත.

මේ සමාජ පරිහානිය නිවැරැදි කිරීමට ප්‍රබල සමාජ සංවිධාන බිහි වී නැත. හැම බෞද්ධ පාසලක ම පාහේ විවිධ විෂයයන් ඉගැන්වීමට සංඝරත්නය ගුරුවරුන් ලෙස පත්කර ඇත. මෙසේ පත්කර සිටින සංඝ රත්නයට අනෙක් විෂයයන් හැරදමා ආගම දහම ඉගැන්වීම අනිවාර්ය කෙරෙන්නේ නම් දරුවන් තුළ ධර්මානුගත හැඩගැස්මක් ඇති කිරීමට එය හේතුවිය හැකි ය.

සමාජය යහමඟ ගැන්වීම සඳහා කැපවන අනෙක් පුරෝගාමී කණ්ඩායම වන්නේ ගුරු පරපුරයි. අද මේ රටේ ලක්ෂයකට වැඩි ගුරු සංඛ්‍යාවක් පාසල් සේවයේ යෙදී සිටින නමුත් සංවරශීලී, සදාචාරාත්මක, විනයගරුක මිනිසුන් සමාජයට එකතු වන්නේ ඉතා අඩුවෙනි.

උසස් අධ්‍යාපන ආයතන ලෙස සැලකෙන විශ්ව විද්‍යාලවලට ඇතුළු වී සිටින තරුණ පරපුරේ හැසිරීම අසංවර වන අවස්ථා කොතෙකුත් දකින්නට ලැබේ.

විශ්ව විද්‍යාල තුළ මෙසේ අසංවර ලෙස, අවිනයෙන් හැසිරෙන අය සමාජගත වී ගුරු තනතුරු හා රජයේ කළමනාකරණ තනතුරු ගත්විට ඔවුන්ගෙන් බොහෝ විට සමාජයට ගලා යන්නේ ගුණ දහමින් පෝෂිත ජීවන රටාවක් නොවේ. රොබෝවරුන් වැනි මිනිසුන් සමාජයට එකතු වීමට මේ අයගේ පුරෝගාමීත්වය බලපානු ලැබේ.

දරුවන්ගේ ගුරුවරුන් ලෙස ක්‍රියා කරන අය, දරුවන්ට යහ දිවි පෙවෙතක් හිමිකර දීමට කැපවී කටයුතු කරන්නේ නම්, සමාජය යහමඟ ගැන්වීමට එය ප්‍රබල හේතුවක් විය හැකි ය.

සමාජය හදන උතුම් ගුරු වෘත්තිය අද මුදලට අලෙවි වී තිබේ. මුදල් පසුපස හඹායන ඇතැම් ගුරුවරු උපකාරක පන්තිවලට ඇබ්බැහි වී උතුම් ගුරු වෘත්තිය බාල්දු කර දමා ඇත. අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් සේ රට පුරා විකිණෙන්නට පටන් ගෙන ඇත. බොහෝ පාසල්වල අ.පො.ස. උසස් පෙළ කරන පන්තිවල පාසල් කාලය තුළත් ඉගෙන ගන්නා දරුවන් නැත. ඔවුන් බොහෝ විට උපකාරක පන්තිවල ය. පෙරදා පාසල් දිනවලින් 80%ක් වත් පාසලට පැමිණ නැති ළමුන්ට විභාගවලට පෙනී සිටීමට අවසර නැත. පාසල්වල උසස් පෙළ ඉගෙන ගන්නා ළමුන් අති බහුතරය පාසල් කාලය තුළත් උපකාරක පන්තිවල ය. මුදල් පසුපස හඹා යන අධ්‍යාපන රටාවක් සමාජය තුළ පැළපදියන් වීම ගුණ ධර්ම නොදන්නා තරුණ සමාජයක් බිහිවීමට හේතු වී තිබේ.

තුන්වෙනුව වෙදවරු මානව සමාජයේ පෙරගමන්කරුවෝ ය. ඔවුහු සමාජයේ නිරෝගී බව සහ පැවැත්ම සඳහා ඇපකැපවී පෙර දා කටයුතු කළහ. රෑපානක වුවත් ගම ගෙදරක ලෙඩක් දුකක් ඇති වුවහොත් බෙහෙත් සැරයටිය ද, ලන්තෑරුම ද අතැතිව ලෙඩා සොයා ගොස් ඔහුට ප්‍රතිකාර කර සුවපත් කිරීම පෙරදා විසූ උතුම් වෙදවරුන්ගේ සිරිතකි. ඔවුහු සල්ලි මිල මුදල් කිසිවක් නොගෙන ගරු බුහුමනට අතට ලැබෙන බුලත් කොළය ගෙන වෙදකම් කොට ජනතාව සුවපත් කළහ. මෙම ගෞරවණීය වෙද රටාව අද වනවිට මුළුමනින් ම සේදී ගොස් ඇත.

මුළු මහත් රටම විදේශීය වෙදකම පැතිරී ගොස් විදේශීය බෙහෙත් කඩ හැම නගරයක ම දකින්නට ලැබෙන අතර, දොස්තර කඩ ද හැම නගරයක ම පැතිරී ඇත. රෝගියකුට රුපියල් තුන් හාරදාහක් වැය නොකොට දොස්තර කඩේකින් එළියට බැහීමට නුපුළුවන. බොහෝවිට ඔවුන් රෝග විනිශ්චය කරන්නේ ලේ, මුත්‍රා තවත් බොහෝ දේ යන්ත්‍රානුසාරයෙන් පරීක්ෂා කිරීමෙනි. මෙම පරීක්ෂණ සඳහා විශාල වියදමක් දරන්නට රෝගියාට සිදුවේ.

රජයේ පාසල් අභිබවා ගොස් උපකාරක පන්ති ඉදිරියට පැමිණ ඇතිවාක් මෙන් රජයේ රෝහල් අභිබවා ගොස් දොස්තර කඩ සේවය ඉදිරියට පැමිණ මුදල මුල් කරගත් සමාජ රටාවක් බිහි වී ඇත.

වැටත් නියරත් ගොයම ගිල ගන්නාක් මෙන් සමාජ සංරක්ෂණයට පුරෝගාමීන් වී සිටින සඟ, ගුරු, වෙද පරපුරේ බොහෝ අය සිය භූමිකාව නොසලකා කටයුතු කිරීමේ හේතුවෙන් මුදල මුල් කරගත් සමාජ රටාවක් බිහි වී නො මිනිසුන් බෝවන්නට පටන්ගෙන තිබේ. එය වහා වෙනස් කළ යුතු තම තමන් විසින්ම ය.

සම්බුදු දහමට එකඟව ජීවන පැවැත්ම සකසා ගන්නා පුද්ගලයාට එය අසීරු නැත. තමන් බෞද්ධ යැයි ලෝකයට පෙන්වන්නට විවිධ ආගමික උත්සවවල දී කැපී පෙනුණාට වැඩක් නැත. ධර්මය ජීවිතයට ද ප්‍රායෝගික විය යුතු ම ය. එවිට ය තමන්ට ද හිත, අනුන්ට ද හිත පුද්ගලයෙක් නිර්මාණය වනුයේ. එවැන්නෝ රටට, ලෝකයට ම වාසනාවකි.



ආචාර්ය
**නුගේතැන්නේ පඤ්ඤානන්ද හිමි**



# ධර්මකාමී ශික්ෂාකාමී ශිෂ්‍ය පිරිසක් ගොඩනඟනවා

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ කල්‍යාණී කාරක සභික මැලේසියාවේ ප්‍රධාන සංඝනායක කුඩාඅරුක්ගොඩ ශ්‍රී මහේන්ද්‍රාරාමය කිදෙල්පිටිය වැල්මිල්ල ශ්‍රී නිකේතනාරාමය උභය විහාරාධිපති මලක්කාවේ සෙක්ක්‍යා විහාරාධිපති**

## අලුබෝමුල්ලේ රතනසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය

**කුඩා කාලයේ උතුම් වූ පැවිදි බිමට පත්ව දේශීය සහ විදේශීය ධර්මදූත ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් ප්‍රකටව වැඩ සිටින ඔබ වහන්සේ මේ තත්ත්වයට පරිවර්තනය වීම සඳහා ගුරු හාමුදුරුවරුන්ගෙන් ලැබුණු ආභාසය මොන වගේද? අපේ හාමුදුරුවනේ**

1969 වර්ෂයේ ජුනි 29 වැනි දා අලුබෝමුල්ලේ රතනසිරි යන උතුම් ශාසනික නාමයෙන් සම්මා සම්බුද්ධ ශාසනයේ ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගැනීමට තරම් මම පුණ්‍යවන්ත වුණා. අලුබෝමුල්ල කුඩාඅරුක්ගොඩ ශ්‍රී මහේන්ද්‍රාරාම විහාරස්ථාන පුණ්‍යභූමියේ දී පැවැත්වුණු උතුම් පැවිදි පින්කම සඳහා වැඩමවා වදාළ මගේ ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේ ඇරැව්වල පඤ්ඤාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, දඹර සුමනරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වගේම උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ එවකට ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේ වශයෙන් වැඩසිටි අතිගෞරවාර්හ මොල්ලිගොඩ අරියවංශ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පුණ්‍යානුමෝදනාපූර්වක ව කෘතවේදී ව ගෞවරයෙන් සිහිපත් කළ යුතුයි.

ඒ වගේම නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී අර්ථචර්යාවෙහි පිළිපන් සංඝ නේතෘන් වහන්සේගේ සෙවණේ පැවිදි දිවියට ඇවැසි සාමණේර බණ දහම් මූලික ශාසනික වත් පිළිවෙත් හොඳින් පුරුදු පුහුණු වෙමින් ධර්ම ශාස්ත්‍රීය කටයුතු සඳහා පානදුර පින්වත්ත සද්ධර්මාකර පිරිවෙනට ඇතුළත් වුණා.

එවකට එම පිරිවෙනෙහි වැඩ සිටි සාර්වභෞම පාණ්ඩිත්‍යයෙන්, සංඝ ශෝභන ගුණයන්ගෙන් පිරිපුන් ශාස්ත්‍රඥයන් වහන්සේගේ අවවාද අනුශාසනා ලබමින් ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගැනීමට භාග්‍යවන්ත වුණා. එවැනි වියත් ඇදුරුමඬුල්ලක් හමුවේ ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීමෙන් ලැබුණ ශික්ෂණය, ශ්‍රමණ සාරුප්‍යයේ පූජනීයත්වය පැවිදි දිවිය ප්‍රභාෂ්වරවීමට හේතු වුණ බවත් මේ අවස්ථාවේ දී ගෞරවපූර්වකව සිහිපත් කිරීම වැදගත්.

එම කාලපරිච්ඡේදයේ දී ම නිසි වයස සම්පූර්ණ වීමත් සමඟ පැවිදි ආචාර්යයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ශ්‍රීමත් මහානායක ධුරන්දර අතිපූජනීය වන්දනීය ලබුගම ලංකානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් අධිශීල සංඛ්‍යාත උතුම් උපසම්පදා ශීලයට පත්වීමට තරම් ලබා තිබූ සංසාරගත පුණ්‍ය මහිමය බලවත් වුණා.

ඒ කාලය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් බාහිර උපාධිය ලබමින්, ලබුගම ලංකානන්ද මහා නායක මාහිමිපාණන් වහන්සේ යටතේ දීප්තිමත් පරිවේණස්ථානයක් වශයෙන් සම්භාවනාවට පාත්‍රවුණ මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙනේ ඉංග්‍රීසි ආචාර්යවරයකු වශයෙන් ගුරු සේවය ආරම්භ කළා.

**සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, තායි, ජපන් ආදී භාෂාන්තරඥනයෙන් පිරිපුන් ඔබවහන්සේ වියත් පඬිරුවනක් වශයෙන් ජාතික සහ ජාත්‍යන්තරව එතෙක් මෙතෙක් සිදුකරන ලද සේවාවන් කෙටියෙන් දැනුවත් කරන්න හාමුදුරුවනේ,**

මූලිකවම තායිලන්තයේ බැංකොක්නුවර වටිපක්නාම් විහාරස්ථානයට වැඩම කරමින් වසරක පමණ කාලයක් තායි භාෂාව හදාරමින් ධර්මදූත සේවයේ නිරත වුණා. ඒ අතර නෝර්වේ ඔස්ලෝ විශ්වවිද්‍යාලයෙන් විශේෂ පාඨමාලාවක් හැදෑරුවා. මැලේසියාවේ තයිපිං නගරයේ බෝධි ලංකාරාම විහාරස්ථානයේ ආගමික කටයුතුවල නිරත වුණා.




පසුව ජපානයේ කබෝෂිමා නගරයේ Hosshoji ජපන් විහාරස්ථානයේ වසර 12ක් වැඩ සිටිමින් බුදුදහම තුළින් ලැබුණු ශික්ෂණය උපයෝගි කර ගෙන විදේශීය ජනතාවට ඇවැසිවුණු නිර්මල බුදුදහම ලබා දෙමින් ඔවුන්ගේ ආධ්‍යාත්මය සංවර්ධනය කළා.

අනතුරුව කොරියාවට වැඩම කරමින් විහාරස්ථානයක් ආරම්භ කිරීමත් සමඟ මැලේසියාවේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය බූටාවත්තේ සරණංකර නායක ස්වාමීන් වහන්සේගේ ආරාධනාව මත නැවත මැලේසියාවට වැඩම කිරීමට සිදුවුණා. මලක්කාව නගරයේ ගරාවැටෙමින් තිබුණු සෙක්ක්‍යා ඉන් ථෙරවාදී බෞද්ධ විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කරමින් සියලු විහාරාරාංගයන්ගෙන් අලංකාරවත් අංගසම්පූර්ණ විහාරස්ථානයක් බවට සංවර්ධනය කළා. වසර 20කට අධික කාලයක් එම විහාරස්ථානය කේන්ද්‍ර කර ගෙන එම ප්‍රදේශයේ සිටින සෑම චීන ජාතිකයකුට ම හොඳට පිරිත් කියන්න පුරුදු පුහුණු කළා. ලංකාවේ විවිධ ප්‍රදේශවල ස්වාමීන් වහන්සේ මලක්කාව ථෙරවාදී විහාරස්ථානය වෙත වැඩම කරමින් වාර්ෂික කඨින පින්කම් වගේම වෙසක් පොහොය නිමිති කරගෙන වාර්ෂිකව විශේෂ පෙරහරක් සංවිධානය කරනවා. සෙක්ක්‍යා ඉන් ථෙරවාදී විහාරස්ථානය මලක්කාවේ තිබුණත්, ලංකාවේ විහාරස්ථානයක තිබෙන අසිරිය දකින්න පුළුවන්. එම ප්‍රදේශවල ස්වාමීන් වහන්සේ අඩු නිසාම පාංශුකූලය වෙනුවෙන් වෙනම ගිහි කණ්ඩායමක් සූදානම් කර තිබෙනවා.

2005 වර්ෂයේ දී තරුණ ලෝක බෞද්ධ සංවිධානයේ නියෝජ්‍ය සභාපතීන් වහන්සේ වශයෙන් රටවල් 140ක් නියෝජනය වන ආකාරයට ජාත්‍යන්තර සමුළුවක් පැවැත්වීමට කටයුතු කළා. එම සමුළුව මලක්කාව සෙක්ක්‍යා ඉන් විහාරස්ථානය කේන්ද්‍ර කර ගෙන පැවැත්වුණ නිසාම එම විහාරස්ථානයටත්, මලක්කාවටත් ජාත්‍යන්තර වශයෙන් විශේෂ කීර්තියක් ලැබුණා.

මලක්කාවේ සිදුකරන ජාත්‍යන්තර ආගමික, ශාසනික සේවය සම්භාවනාවට පත් කළ මලක්කා රාජ්‍ය ඉන්දියාවේ ක්වාලාලම්පූර් විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධ වෙමින් ආචාර්ය උපාධියක් පිරිනැමීමටත් කටයුතු කළා.

මැලේසියාව, ජපානය, ජර්මනිය, ඉතාලිය, වියට්නාමය, කාම්බෝජය, ඔස්ට්‍රේලියාව ආදි රටවල ධර්ම සාකච්ඡා පවත්වමින් බුදුදහමේ මූලික හරය ඔවුන්ට අවබෝධ කරදීමටත් කටයුතු කළා.

එම ජාත්‍යන්තර සම්බන්ධතා පදනම් කර ගෙන සදහම් පණිවුඩය ලෝකයාට බෙදාදෙමින් සමාජසේවා කටයුතු සිදුකර ගෙන යනවා. ලංකාවට විපතක් පැමිණි හැම අවස්ථාවක දී ම ආධාර උපකාර කිරීමට කටයුතු කළා. අපේ දරුවන්ගේ නැණ නුවණ දියුණු කිරීමේ අරමුණින් ඔවුන්ගේ අධ්‍යාපනය නඟාසිටුවීමට හැකි සෑම උපකාරයක් ම තවදුරටත් සිදුකරගෙන යනවා.

කුඩාඅරුක්ගොඩ ශ්‍රී මහේන්ද්‍රාරාම විහාරස්ථානය වැල්මිල්ල ශ්‍රී නිකේතනාරාම විහාරස්ථානය සංවර්ධනය කරමින් සම්බුද්ධ ශාසනයට ඇවැසි ධර්මකාමී ශික්ෂාකාමී ශිෂ්‍ය පිරිසක් බිහිකිරීම සඳහා කටයුතු කරනවා. සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසා ශ්‍රමණ සාරුප්‍යයෙන් පිරිපුන් භික්ෂු ආකල්පයන්ගෙන් පෝෂණය වුණු භික්ෂු පිරිසක් ගොඩනැඟිය යුතුමයි.

බුදුදහම වගේම බෞද්ධ දර්ශනයේ හරය ලෝකයා වෙත දායාද කරමින් සම්බුද්ධ ශාසනය වෙනුවෙන් සිදුකරන සේවය සම්භාවනාවට පාත්‍ර කරමින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගරුතර මහා සංඝරත්නය විසින් මැලේසියාවේ ප්‍රධාන සංඝනායක ධුරය පිරිනැමීමට කටයුතු කළා.

**ධර්ම විනයධර බහුශ්‍රැත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වන ඔබ වහන්සේගේ කුඩා කාලය ආවර්ජනය කරමින් වර්තමාන කුඩා භික්ෂූන් වහන්සේ අතර දක්නට ලැබෙන ප්‍රවණතාවන් පිළිබඳ දරන අදහස පැහැදිලි කරමින්ම සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ**

අපි පුංචි කාලයේ අපට බොහොම අඩුපාඩුකම් තිබුණා. අඩු පහසුකම් යටතේ කටයුතු කිරීමට සිදුවුණත්, සම්බුද්ධ ශාසනය පිළිබඳ ගෞරවයෙන් උතුම් භික්ෂු ආකල්ප ගොඩනඟාගෙන උත්තරීතර පැවිදි ජීවිතයකට අවශ්‍ය පසුබිම ගොඩනඟා ගත්තා. නමුත් වර්තමාන ලංකාවේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ ප්‍රතිරූපය පිළිබඳ ජාත්‍යන්තරය තුළ පවතින අදහස් එතරම් සුදුසු නැහැ. කොණ්ඩ රැවුල වවාගෙන හර්තාල් කරනවා. බෞද්ධ භික්ෂුවගේ කාර්යභාරය මේකද? භික්ෂුවගේ විනය මේකද? කියලා ඔවුන් හිතනවා. එම ප්‍රතිරූපය බෞද්ධ භික්ෂුවකට එතරම් ගැළපෙන්නේ නැහැ. මම ලබාගත් අත්දැකීම් තුළින් පැරැණි ශාසනික සම්ප්‍රදාය අනුගමනය කරමින් සුවිශේෂී ශිෂ්‍ය පිරිසක් ගොඩනැඟීමට කටයුතු කරගෙන යනවා.

විශාල ප්‍රමාණයෙන් ලංකාව පුරාම සිදු කළ නොහැකි වුණත්, මගේ ශක්ති ප්‍රමාණයෙන් ශාසන සාරුප්‍ය රැකගෙන කටයුතු කරන ධර්මකාමී ශික්ෂාකාමී ශිෂ්‍ය පිරිසක් බිහි කිරීම අරමුණ කරගෙන කටයුතු කරනවා. අධ්‍යාපනයේ දී වුණත්, ප්‍රාචීන භාෂාවන්ට මුල්තැන දෙමින් විදේශීය භාෂාන්තර ඥනය මුල්කරගෙන පැරැණි ශාසනික සම්ප්‍රදාය අනුගමනය කළ යුතුයි. පැරැණි දින චර්යාව බොහෝදුරට ගිලිහී ඇති බවත් පේනවා. එම ස්වභාවය මඟහරවා ගැනීම වැදගත්. සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම, අභිවෘද්ධිය වෙනුවෙන් හැකි සෑම ආකාරයකින් ම කටයුතු කර ගෙන යනවා.

හේමමාලා රන්දුනු

# දුක අවබෝධ කරගෙන දුකෙන් මිදෙන්න



නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

මා විසින් මෙසේ අසන ලදී.

**එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායෙහි වැඩ වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා පස්වග භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.**

"මහණෙනි, රූපය අනාත්ම ය, මහණෙනි, ඉදින් මේ රූපය ආත්ම ය නම්, මේ රූපය ආබාධ පිණිස නොපවත්නේ ය. මගේ රූපය මෙසේ වේවා, මගේ රූපය මෙසේ නොවේවා'යි කියා රූපයෙහි කැමති ආකාරයක් ද ලබන්නේ ය".

"මහණෙනි, යම් හෙයකින් රූපය අනාත්ම ද, එහෙයින් රූපය ආබාධ පිණිස පවතී. 'මගේ රූපය මෙසේ වේවා, මගේ රූපය මෙසේ නොවේවා'යි කියා රූපයෙහි කැමති ආකාරයක් ද නො ලබන්නේ ය."

"මහණෙනි, වේදනාව අනාත්මය, මහණෙනි, ඉදින් මේ වේදනාව ආත්මය වූයේ නම්, මේ වේදනාව ආබාධ පිණිස නොපවත්නේ ය. මගේ වේදනාව මෙසේ වේවා, මගේ වේදනාව මෙසේ නොවේවා'යි කියා වේදනාවෙහි ලැබෙන්නේ ය."
"මහණෙනි, යම් හෙයකින් වනාහි වේදනාව අනාත්ම ද, එහෙයින් වේදනාව ආබාධ පිණිස පවතී. 'මගේ වේදනාව මෙසේ වේවා, මගේ වේදනාව මෙසේ නොවේවා'යි ලෙසින් සංඥාවෙහි (මෙබන්දක්) නො ලබන්නේ ය".

"මහණෙනි, සංස්කාර අනාත්මය, මහණෙනි, ඉදින් මේ සංස්කාර ආත්මය වූවාහු නම්, මේ සංස්කාර ආබාධ පිණිස නො පතින්නාහ. මාගේ සංස්කාර මෙසේ වෙත්වා, මගේ වේදනාව මෙසේ නො වෙත්වායි' කියා සංස්කාරයන්හි ලබන්නේ ය". "මහණෙනි, යම් හෙයකින් වනාහි සංස්කාර අනාත්ම ද, එහෙයින් සංස්කාර ආබාධ පිණිස පවතිත්. 'මගේ සංස්කාර මෙසේ වෙත්වා, මගේ සංස්කාර මෙසේ නො වෙත්වායි' ලෙසින් සංස්කාර කෙරෙහි නො ලැබන්නේය".

"මහණෙනි, විඥානය අනාත්ම ය. මේ විඥානය ආත්මය වූයේ නම්, මේ විඥානය ආබාධ පිණිස නො පතින්නාහ. මාගේ මේ විඥානය මෙසේ වේවා, මගේ මේ විඥානය මෙසේ නොවේවා'යි කියා විඥානයෙහි ලබන්නේ ය". "මහණෙනි, විඥානය අනාත්ම ද, එහෙයින් විඥානය ආබාධ පිණිස පවතියි. 'මගේ විඥානය මෙසේ වේවා, මගේ මේ විඥානය නොවේවායි' ලෙසින් විඥානය කෙරෙහි නො ලබන්නේ ය."

"මහණෙනි, මේ ගැන නුඹලා කුමක් සිතන්නාහු ද, රූපය නිත්‍ය හෝ වෙයි ද? අනිත්‍ය හෝ වෙයි ද?" "ස්වාමීනි, අනිත්‍යය"
"යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේ ද?"

"ස්වාමීනි දුක ය,"

"යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන (වෙනස් වන) සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේ ද? ස්වාමීනි, එය නොවේ ම ය."

"මහණෙනි, මේ ගැන නුඹලා කුමක් සිතන්නාහු ද, වේදනාව නිත්‍ය හෝ වෙයි ද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනී, අනිත්‍ය ය," "යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේ ද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍ය ද, දුකද, පෙරළෙන (වෙනස් වන) සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේ ද? ස්වාමීනි, එය නොවේ ම ය."

"මහණෙනි, මේ ගැන නුඹලා කුමක් සිතන්නාහු ද, සංඥාව නිත්‍ය හෝ වෙයි ද? අනිත්‍ය හෝ වෙයිද?" "ස්වාමීනි, අනිත්‍ය ය," "යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුක ය," "යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේද? ස්වාමීනි, එය නොවේ ම ය."

"මහණෙනි, මේ ගැන නුඹලා කුමක් සිතන්නාහු ද, සංස්කාර නිත්‍ය හෝ වෙත් ද? අනිත්‍ය හෝ වෙත් ද?" "ස්වාමීනි, අනිත්‍ය යි,"

"යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේ ද?" "ස්වාමීනි දුකය,"

"යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මය යි කියා දැකීමට සුදුසු වේද? ස්වාමීනි, එය නොවේ ම ය."

"මහණෙනි, ඒ කුමකැයි සිතන්නාහු ද, විඥානය නිත්‍ය හෝ වෙයි ද? අනිත්‍ය හෝ වෙයි ද?"

"ස්වාමීනි, අනිත්‍ය යි,"

"යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේද?" "ස්වාමීනි දුක ය,"

"යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු වේ ද?

ස්වාමීනි, එය නොවේම ය."

"මහණෙනි එසේ හෙයින්,

අතීත - අනාගත වර්තමාන, අධ්‍යාත්මික වූ හෝ, බාහිර වූ ඕලාරික වූ හෝ, සියුම් වූ හෝ, හීන වූ හෝ, ප්‍රණීත වූ හෝ, දුර වූ හෝ, සමීපයෙහි වූ හෝ යම්කිසි රූපයක් වේ ද, ඒ සියලු රූප 'මාගේ නොවෙයි. මම නොවෙමි. මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් (විදර්ශනා ඥානයෙන්) දත යුතුයි.

> **"යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සැප හෝ වේ ද?" "ස්වාමීනි දුකය," "යමක් අනිත්‍ය ද, දුක ද, පෙරළෙන සුලු ද, එය මාගේ ය. එය මම වෙමි. එය මාගේ ආත්මය යි කියා දැකීමට සුදුසු වේද? ස්වාමීනි, එය නොවේ ම ය."**

අතීත - අනාගත වර්තමාන, ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ ඕලාරික වූ හෝ සියුම් වූ හෝ හීන වූ හෝ, ප්‍රණීත වූ හෝ දුර වූ හෝ සමීපයෙහි වූ හෝ යම්කිසි වේදනාවක් වේ ද, ඒ සියලු වේදනා 'මාගේ නොවෙයි. මම නොවෙමි. මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් (විදර්ශනා ඥානයෙන්) දත යුතුයි.

අතීත - අනාගත වර්තමාන, ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ ඕලාරික වූ හෝ සියුම් වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ දුර වූ හෝ සමීපයෙහි වූ හෝ යම්කිසි සංඥාවක් වේ ද, ඒ සියලු සංඥා 'මාගේ නොවෙයි. මම නොවෙමි. මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් (විදර්ශනා ඥානයෙන්) දත යුතුයි.

අතීත - අනාගත වර්තමාන, ආධ්‍යාත්මික වූ හෝ, බාහිර වූ ඕලාරික වූ හෝ, සියුම් වූ හෝ, හීන වූ හෝ, ප්‍රණීත වූ හෝ, දුර වූ හෝ, සමීපයෙහි වූ, හෝ යම්කිසි සංස්කාරයක්වේ ද, ඒ සියලු සංස්කාර 'මාගේ නොවෙයි. මම නොවෙමි. මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් (විදර්ශනා ඥානයෙන්) දත යුතුයි.

අතීත - අනාගත වර්තමාන, අධ්‍යාත්මික වූ හෝ බාහිර වූ ඕලාරික වූ හෝ සියුම් වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ දුර වූ හෝ සමීපයෙහි වූ හෝ යම්කිසි විඥානයක් වේ ද, ඒ සියලු විඥාන 'මාගේ නොවෙයි, මම නොවෙමි. මාගේ ආත්මය නොවෙයි' කියා තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් (විදර්ශනා ඥානයෙන්) දත යුතුයි.

"මහණෙනි මෙසේ දක්නා වූ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ රූපය කෙරෙහි ද කලකිරෙයි, වේදනාව කෙරෙහි ද, සංඥාව කෙරෙහි ද, සංස්කාරයන් කෙරෙහි ද, විඥානය කෙරෙහි ද, කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි, නො ඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි, මිදුණු කල්හි මිදුණේ ය යන නුවණ (පහළ) වෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලදී. කළ යුත්ත කරන ලදී. කෙලෙස් ක්ෂය කිරීම සඳහා කළ යුතු අනෙකක් නැත්තේ යැයි දනියි" භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්හ.

මේ ධර්මය දේශනා කළ කල්හි පස්වග භික්ෂූන්ගේ සිත් උපාදාන විසින් නොගෙන ආශ්‍රවයන්ගෙන්, කෙලෙසුන්ගෙන් මිදුණාහු ය.

"චිරං තිට්ඨතු ලෝකස්මිං - සම්මා සම්බුද්ධසාසනං
තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බේපි පාණිනො"

(නිර්මල බුදු සසුන චිරාත් කාලයක් ලෝකයෙහි පවතීවා සියලුම සත්වයෝ ඒ නිර්මල බුදු සසුනට නිරතුරු ගෞරව කරත්වා )

**අතුරුගිරියේ ධීරානන්ද හිමි**

දුටුගැමුණු මහ රජතුමා

85 කොටස



# රජරට ආගමික ප්‍රබෝධය අපේ වාසියට හරවා ගතයුතුයි

**‘කුමරියනි, ඔබට බොහෝම ස්තූතියි. ඔබට ඇති වූ සැකය අපටත් ඇති වූ නිසයි හදිසියේ ම රජතුමා හමුවන්නට ආවේ. මට ලැබුණු රහස් තල්පත තුණ්ඩිල හෝ දීඝාභය කියවා ඇති බව දැන් තහවුරු වෙනවා.”**

“මා පැවසූ කිසිවක් නොදන්නා ලෙස පිය රජතුමා සමඟ සාකච්ඡා කරන්න.”

“මහ සෙනෙවිතුමනි, රජ කුමරිය රටේ පවතින ප්‍රධාන ප්‍රශ්නය පිළිබඳ අපට වඩා පුළුල් ලෙස සිතන බව පෙනී යනවා. එළාර මහ රජතුමා, දුටුගැමුණු රජු යටතේ ප්‍රාදේශීය රජකු ලෙස ඉන්නට කැමති නම් යුද්ධය නතර කළ හැකි බව ඇය පවසනවා. මේ රටේ අයිතිය ගැමුණු රජුට යැයි ඇය තර්ක කරනවා.”

“සිදුවිය යුතු දෙය සිදුවන රටක් නොවෙයි මේක. එහෙමනම් මට මගේ උරුමයන් ලැබෙන්නට ඕනෑ”.

‘දීඝාභය මහ සෙනෙවිතුමනි, මේ ආත්මාර්ථකාමීව සිතිය යුතු අවස්ථාවක් නොවෙයි. පොදුවේ අප මුහුණ පා ඇති ගැටලුවට සිත යොදමු. සදාචාර විරෝධීව ඔබට ආ ලිපියක් කඩා බැලූ ඔවුන් රජතුමාට කේලාම් කියනවා. රජතුමා ඔබ කෙරෙහි පවතින විශ්වාසය පළුදු කිරීමටයි ඔවුන්ට වුවමනා. එයින් ඔවුන්ට වන යහපතක් නැහැ. සිදුවන්නේ අයහපතක් ම පමණයි.”

‘අන්න කේලම්කරුවන් දෙදෙනා යනවා. අපි දැන් යමු රජ මාලිගයට. කිසිවක් නොදන්නා ලෙසට තල්පත රජතුමාට පිළිගන්වමු. කිසිවකු විසින් තල්පත කඩා කියවා තිබූ බව පමණක් කියමු.”

එළාර රජතුමා සෙන්පතිවරු දෙදෙනා පිළිගත්තේ ය. තල්පත කියවා බලා එය ආපසු දුන්නේ ය.

“මේ ඔත්තුකරුවා අල්ලා දඬුවමක් දෙන්නට ඕනෑ” යි කීවේය.

“සිරිනාග, තොප මේ පොසොන් පොහොයට පින්කමක් කරන්නට යන බව කෘෂ්ණා දියණිය කීවා. ඒ සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් ලැබේවි.”

මගේ මෑණියන්ට පින් අනුමෝදන් කිරීමට රහතන් වහන්සේ දෙදහසකට දන් පිරිනැමීමට ආරාධනා කළා. දැන් එය සිව් ගුණයක් වෙලා. ජයනාථ මහ සිටුතුමා, සුමන මහ සිටුතුමා වෙනුවෙන් දෙදහසක් රහතන් වහන්සේට, රජකුමරිය මෑණියන් වහන්සේට පින් පිණිස දෙදහසක් රහතන් වහන්සේට ආරාධනා කරලා. පුණ්ණා ඇයගේ පියා මිත්‍ර මහ සෙනෙවිට පින් පිණිස දෙදහසක් රහතන් වහන්සේ සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට තීරණය කරලා. එදා සවස පැවැත්වෙන බෝධි පූජාවට අනුරාධපුර රාජධානියේ සියලුම බෞද්ධයන් සහභාගි වෙතැයි අපේක්ෂා කරනවා.

“මේ ආගමික ප්‍රබෝධය අපට වාසිදායක වන ලෙසට සංවිධානය කරන්න. එදිනට ඒකරාශි වන සියලුම ජනතාවට ආහාරපාන රජවාසලෙන් සැපයීමට කටයුතු සූදානම් කරන්න.”

“දීඝාභය, සිංහල බෞද්ධ ජනතාව මා කෙරෙහි වූ කලකිරීම් දැන් අඩුයි. මම හැමදාමත් කල්පනා කළේ මේ දිවයින අපේ රාජධානියක් කර ගන්නයි. ප්‍රාදේශික රාජ්‍යයන් කිහිපයක් අපට යටත් කරගත හැකි වුවත් කාවන්තිස්ස, කැලණිතිස්ස රජවරු ඒකට කැමැති වුණේ නැහැ. කාවන්තිස්ස රජු ඉතා සූක්ෂ්ම විදියට ඒ රාජ්‍ය කිහිපය අල්ලා ගත්තා.”

“මේ තත්වය ළඟදීම වෙනස් වෙනවා. ලබන වසරේ මුල් භාගයේ දී මගේ බෑනා කෙනකු පහළොස් දහසක අශ්ව සේනාවක් අරගෙන මෙහි එනවා. අලුත් පන්නයේ ආයුධ තොගයකුත් ලැබෙනවා. එයින් පසුව අපට ලංකාවම යටත් කරගත හැකි වේවි.”

“එවිට ඒ ප්‍රාන්ත රාජ්‍යයන් පවරන්නේ මගේ විශ්වාසවන්ත මහ සෙනෙවිවරුන්ටයි. සිරිනාග වගේ කැපවී වැඩ කරන තවත් දසදෙනකු සිටියා නම් මේ වන විටත් අපට මුළු රටම යටත් කර ගන්නට තිබුණා. සියලු අභ්‍යන්තර ආරක්ෂක කටයුතුවල වගකීම පැවරෙන්නේ සිරිනාගට.”

“රජතුමනි, සිරිනාග කෙරෙහි යුද්ධ මණ්ඩලයේ සියලුම සෙනෙවිවරුන්ගේ විශ්වාසය පසුගිය දා පළවුණා. මේ තල්පත ලද විගසම අප ඔබතුමාට හමුවන්නට ආවේත් ඒ ප්‍රසාදය නිසයි.”

“ඒ ගැන කලබල වෙන්නට එපා. තුණ්ඩිල, දීඝජන්තු දෙදෙනාගේ අදහස් මම පිළිගන්නේ නැහැ.

අනුරාධපුරයේ සහ මිහින්තලයේ පැවැත්වෙන පොසොන් පින්කම වෙනුවෙන් දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම බෞද්ධයෝ රජරටට පැමිණියහ. කිසිදු බාධාවකින් තොරව සියලුම මුරකපොලුවලින් හා තොටමුණුවලින් බෞද්ධ සැදැහැවතුන්ට එන්නට ඉඩ දිය යුතු ය” යන රජ අණ නිසා රාජධානියේ බොහෝ පිරිස් රජතුමා කෙරෙහි ප්‍රාසාදයට පත්වූහ. ඒ අසා එළාර රජු බොහෝ සතුටට පත්විය. එය විශේෂයෙන් රජුට ම දැනගන්නට සිරිනාග විසින් නිර්මාණය කරන ලද ප්‍රවෘත්තියක් බව රජතුමා නොදත්තේ ය.

වසර පනහකට පමණ පසු මුළු අනුරාධපුරයම සුදුවතින් හා කසාවතින් බැබළෙනු දකින්නට ලැබීම බෞද්ධයන්ගේ සතුටට කරුණක් විය. අගනගරය පමණක් නොව ගම්නියම්ගම්වල ද සෑම නිවසක ම බෞද්ධ කොඩි ලෙළ දුන් අතර එය බෞද්ධ රාජ්‍යයක් පහළවීමේ පෙරනිමිති වැනි විය. සිංහල බෞද්ධයෝ පමණක් නොව දෙමළ පුරවැසියෝ ද සතුටට පත්ව සිටියහ.

මහාපාලි දාන ශාලාවේ හත් දහසක් මහ රහතන් වහන්සේට ද, දහසකට අධික භික්ෂුණීන් වහන්සේටද දානය ගෙන එන සැදැහැවතුන්ගෙන් ප්‍රදේශයම පිරී පැවතුණි.

කුණ්ඩල බ්‍රාහ්මණතුමා විසින් මිහින්තලා පූජා භූමිය සැරසිලි කරවන ලද්දේ විය. ශ්‍රී මහා බෝධින් වහන්සේ, ඉසුරුමුණිය, ථූපාරාමය ආදි පූජනීය ස්ථාන වන්දනා කරමින් සැදැහැවතුන් නඟන සාධු නාදයට එක්වන බෙර, දවුල්, හොරණෑ, නාදය පෙර රජ දවස පින්කමක අසිරිය සිහිපත් කරන්නක් විය. කෘෂ්ණා කුමරියත්, පුණ්ණා, අමිතා, දන්තී ආදි යෙහෙළියෝ දාන ශාලාවේ අඩුපාඩු විමසමින් කටයුතු සම්පාදනය කළෝ ය.

දන් පිරිනමන අවස්ථාවේ දී කුණ්ඩල බ්‍රාහ්මණතුමා ද අමාත්‍ය මණ්ඩලයෙහි කිහිප දෙනෙක් ද පැමිණ සිටියහ. සවස් වරුවේ චිත්තගුත්ත මහතෙරුන් වහන්සේ සිදුකළ ධර්ම දේශනයෙන් පින්කම අවසන් විය.

උත්සව ශ්‍රීය නරඹමින්, එළාර මහ රජතුමා ද ඇතු පිට නැඟී නගරය පුරා සංචාරය කළේ ය. දීඝජන්තු ඇතුළු සෙනෙවිවරු ග්‍රාමීය ප්‍රදේශවල සැරිසරමින් ජනතාවගේ පහසුකම් සොයා බැලූහ. නමුත් උපතිස්ස හෝ දීඝාභය නොපැමිණීම කුතුහලයට හේතු විය.

“සිරිනාගගේ පින්කම ඉතාමත් හොඳයි. නමුත් එයින් අප බලාපොරොත්තු වූ දෙය ඉටු වුණේ නැහැ. පිට ප්‍රදේශවලින් ආපු මිනිසුන් නගර වැසියන් ගේ සිත්වලට වැරැදි ආකල්ප ඇතුල් කරලා . සිංහල මිනිසුන්ට විතරක් නොවෙයි දෙමළ මිනිසුන්ගේ සිත් තුළත් වැරදි චිත්‍රයක් මවලා.”

රාජ සභාවේ දී එළාර මහ රජතුමා කීවේ ය. සිරිනාග පුදුමයට පත් විය.

“නැහැ, දේවයන් වහන්ස, ඔබ වහන්සේගේ පාලන කාලය තුළ දී මෙබඳු පින්කමක් කිරීම ගැන සියල්ලෝ ම සතුටු වුණා. ඔබතුමා කෙරෙහි ප්‍රසාදය පළකළා.”

“පුරාවස්තු විනාශ කරලා. බුදු පිළිම කඩා දාලා, විහාර කොල්ලකාලා අනේ මෙහෙමත් අපරාධයක්” කියමින් සොළී පාලනයට සාප කළාලු.

“එබඳු ස්ථාන කිහිපයක් ම පොදු ජනයාට යා නොහැකි ලෙස අප වසා දැමුවා. ථූපාරාමයේ එක් බුදු පිළිමයක් කඩා දමා තිබුණා. එය ඉවත් කරන්නට අපට ඉඩක් ලැබුණේ නැහැ.”

*ඉතිරි කොටස ඉල් පුර අටවක පෝද (01) අන්තර්ජාල කලාපයේ පළවේ*

අයන්ති විතාන